# 2025 නොවැම්බර් මාසයට අදාලව 2025.11.14 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2025.11.14

**වේලාව** - පෙ.ව. 9.30

**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගීත්වය** -

| | | |
|---|---|---|
| 01. වී.සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී.ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10.ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එම්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## 01.පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2025.10.21 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2025.11.03 වන දින යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා 2025.10.21 දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පසුගිය මහ සභා වාර්තාවේ යථා පරිදි කල් දී ඇති යෝජනා අංක 05.01.04 යෝජනාවෙහි යෝජනාව හා තීරණය ඒකමතිකව සහා සම්මත වූ බව දක්වා ඇති නමුත් එම යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ කිහිප දෙනෙකු විරෝධතාවය පලකල බැවින් එම යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ඒකමතිකව සහා සම්මත වීම ලෙස නොව කල්තැබූ යෝජනාවක් ලෙස  සංශෝධනය වියයුතු බව ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා පෙන්වා දෙන ලදී.

එම සංශෝධනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු ඩබ්.එම්.රූපසේන  මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.නිමල් බණ්ඩාර මැතිතුමා  විසින් ස්ථිර කරන ලදී.  එම අවස්ථාවේදී සංශෝධනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන  මැතිතුමා විසින් සිදුකල අතර ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් වෙනත් කරුණු යටතේ අදහස් දැක්වීමේදී ''තැටි සිල්වා මහතා පරිත්‍යාග කළ ඉඩම'' ලෙස දක්වා තිබීම ''ටැට් සිල්වා''  මහතා ලෙස සංශෝධනය විය යුතු බවයි.

ගරු මූලාසනය විසින් එම සංශෝධනයන් පිළිගැනීමට සභාව එකඟ වන්නේදැයි විමසීය.

ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා සංශෝධන පිළිගැනීමට එකඟ වූයෙන් 2025.10.21 දිනැති වාර්තාව  සභා සම්මත කර ගන්නා ලෙස ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

සංශෝධන සහිත වාර්තාව සම්මත කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකළ අතර ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව සංශෝධන සහිත 2025.10.21 දිනැති සභා  වාර්තාව සභා සම්මත විය.

## 02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

### 02.01.කෘතඥතාවය පල කිරීම සම්බන්ධවයි.

2023 වර්ෂයේ සිට මේ දක්වා ඌව පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් වශයෙන් කටයුතු කළ ඩී.එම්.එල් .එච්. දිසානායක මහතා වෙනත් තනතුරක් භාර ගැනීම සඳහා තනතුරින් නික්ම යාමට නියමිතව ඇති බවත්, ඌව පළාත් පාලන කොමසාරිස් වශයෙන් තමා වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම සඳහා මේ දක්වා ලබාදුන් සහයෝගයට සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ස්තූති කර ඇති බව ගරු සභාවට නිවේදනය කරන ලදී.

### 02.02. මාර්ග සංවර්ධන අධිකාරිය සතු ඉඩමේ අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිල්ල ඉවත් කිරීම.

ඒ.එම්.රත්න කුමාර මයා විසින් බදුල්ල වෙන්කලාඩි මාර්ගයේ බිබිල තැපැල් කාර්යාලය අසලින් සතිපොළට යන මාර්ගයෙහි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩමෙහි තාවකාලිකව ඉදිකර ඇති ගොඩනැගිල්ල ඉවත් කර ගන්නා ලෙස වරින් වර දැනුවත් කලද මෙම ඉදිකිරීම ඉවත් කර නොගැනීම හේතුවෙන් මහජනතාවගේ පැමිණිලි බොහෝ ඉදිරිපත් වී ඇති බවත් මෙම ගැටළුව ප්‍රමුඛ කටයුත්තක් ලෙස සලකා මෙම තාවකාලික ගොඩනැගිල්ල ඉවත් කිරීමට කටයුතු කර ගන්නා ලෙස බිබිල, මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු මහතා විසින් බිබිල ප්‍රාදේශීය සභාවට දන්වා එවා ඇති බව ගරු සභාවට නිවේදනය කරන ලදී.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.01. ඉසුරු උයනේ ඉදිවන තෙමහල් ගොඩනැගිල්ලක් සම්බන්ධව මතුව ඇති ගැටලු සම්බන්ධවයි.

එම්.එම්.පී.සී.ගුණසිංහ වන මාගේ ස්වාමිපුර්ෂයා හා දරුවන් දෙදෙනා සමග 2018 වර්ෂයේ සිට අංක 80,ඉසුරු උයන, මහියංගන පාර,බිබිල ලිපිනයෙහි ඉදි වෙමින් පවතින නිවසේ පදිංචිව සිටිමි. මාගේ ඉඩමට දකුණු පස ඩී.පී. ධම්මික විජේකුමාර යන අයගේ ඉඩමේ ඉදිවෙමින් පවතින තෙමහල් ගොඩනැගිල්ල හේතුවෙන් මේ වන විට අප ගැටළු රාශියකට මුහුණ දී සිටින්නෙමු.

එම ඉදි කිරිම අනවසර බැවින් එහි ඉදිකිරීම් කටයුතු නවත්වන ලෙස ඉල්ලමින් 2021.06.21 වන දින ඉසුරු උයන ප්‍රදේශවාසීන් එක්ව මහජන පෙත්සමක්ද ඉදිරිපත් කර ඇත.(පිටපත අමුණා ඇත) එහි ප්‍රතිඵලයක් වශයෙන් අදාළ ඉදිකිරීම සඳහා විධිමත් අවසර ලබා දෙන තෙක් ඉදිකිරීම් කටයුතු නතර කිරීමට ප්‍රාදේශීය සභාව හා පොලීසිය එක්ව පියවර ගන්නා ලදි.

නමුත් මේවන විට අදාළ අවසරය ලබා ගත් බව පවසමින් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර ඇතත් ඒ සම්බනධව ගැටළු පවතී.

- මෙම ඉදිකිරීම සඳහා පස් පුරවා තැලීම් කටයුතු දවස් දෙකක් පුරා නොනවත්වා තැලීම් යන්ත්‍රයන් උපයෝගී කර ගනිමින් සිදුකල අතර ඒ හේතුවෙන් යාබද නිවැසියන් වන අප මහත් පිඩාවට පත් වුණෙමු. නිවස පිටුපස කොරිඩෝව මෙන්ම බිත්තිද ඉරිතලා යාම්වලට ලක්ව ඇත.
- අප නිවස වටා තාප්පයක් ඉදිකර ඇති අතර ඔහු එම ඉදිකිරීමේ අත්තිවාරම දමා ඇත්තේ තාප්පය හා සම්බන්ධ කරමිනි.
- මුලදී තාප්පය යටින් හාරා බේස් වළවල් කැපීමට උත්සාහ කලත් අපගේ දැඩි විරෝධතාව හමුවේ එය නතර කරන ලදි. නමුත් බිත්ති බැඳිම හා කොන්ක්‍රීට් දැම්මේ කටයුතු හේතුවෙන් අප තාප්පයට හා වත්ත ඇතුළත බදාම හා කොන්ක්‍රීට් වැටීම නිරන්තරයෙන් සිදුවේ. තාප්පය මත වැටෙන කොන්ක්‍රීට් තට්ටු දිනපතා අප විසින් වතුර ගසා පිරිසිදු කළ යුතුව ඇත. සිටුවා ඇති වම්බටු වගාව මතට බදාම තට්ටු වැටී එය මුලුමනින්ම විනාශ වී ඇත. අදාළ ඡායාරූප මේ සමඟ ඉදිරිපත් කර ඇත.
- රජයේ කාර්යාලයක සේවයේ නියුතු මා ද ව්‍යාපාර කටයුතු වල නියැලෙන ස්වාමිපුරුෂයාට නිරන්තරයෙන් නිවසේ නොරැදෙන අතර දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳව ද ගැටළුකාරී තත්වයන් පවතී.
- මෙම ධම්මික විජේකුමාර නැමැත්තා පදිංචි නිවස පිහිටා ඇත්තේ අප නිවසට ඉදිරිපසින් බැවින් මේ සම්බන්ධව ගැටුම් ඇතිකර නොගෙන සුහදව කතාබස් කිරීමට අවස්ථා කිහිපයකදීද උත්සාහ කළද අදාළ නිවෙස් හිමි කාන්තාව එම සැම අවස්ථාවකදීම ඇය හට බැණ වදින්නේ යැයි මාගේ ස්වාමිපුර්ෂයා හට චෝදනා කරමින් පොලිස් පැමිණිලි දමා ඇති බවද කණගාටුවෙන් වුවද දැනුම් දෙමි.

- අප ජිවත්වන ඉඩම ඇතුළුව යාබද සියළු ඉඩම් සුළු වර්ෂා තත්වයකදී වුවද උල්දිය දැමීම්වලට නතුවේ. එවන් තත්වයක් යටතේ දී මෙවන් ඉදිකිරීම් කටයුත්තක ප්‍රමිතිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කල යුතු නොවේද?
- වසර හතරකට ආසන්න කාලයක් සිටුවා දිරායාමට ලක්වූ (බේස් වල තුළ කම්බි නෙට් බැද තිබු) කම්බි යොදා මෙහි බිම් මට්ටමේ සියළු කණු දමා ඇත. මෙහි ඉදිකිරිම් කටයුතු සිදු කරනු ලබන්නේ ගොඩනැගිල්ල විකුණා දැමීමේ අදහසින් ප්‍රමිතියකින් තොරව මෙහි ඉදිකිරීම් සිදු කරන්නේ නම් අපගේ දේපළ වල සුරක්ෂිතතාවය පිළිබඳව ගැටළු ඇතිවේ.
- අප කිසිවකුට කරදරයක් නොකර සාමකාමීව දිවි ගෙවන්නන් වන අතර අදාළ ඉඩම් හිමි කාන්තාව නිවෙස අවට සියළු ඉඩම් හිමියන් සමග නිරන්තරයෙන්ම ගැටුම් ඇතිකර ගන්නා යම් මානසික රෝගී තත්වයකින් පෙළෙන තැනැත්තියක බව නිරික්ෂණය වේ.

පහත ගැටළුකාරී තත්වයන් පිළිබඳව ප්‍රමුඛ අවධානය යොමු කරන මෙන් ඉල්ලා ඇත.

- ➢ මෙම ගොඩනැගිලි සැලැස්මට අනුමැතිය ලබාදී තිබේද? එසේ නම් ඒ කුමන නිර්ණායකයන් යටතේ ද යන්න පිළිබඳවත්,
- ➢ යම් හෙයකින් මේ සඳහා අනුමැතිය ලබා දී ඇති නම් එම අනුමත සැලැස්මට අනුකූලවම මෙහි ඉදිකිරීම් සිදු කරනවාද යන්න පිළිබඳවත් මා දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.

මෙම පෙත්සම බිබිල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බවත් ඒ පිළිබඳව නිරීක්ෂණය කිරීමට කාර්මික නිළධාරි වෙත යොමු කර ඇති බව ගරු මූලාසනය විසින් පවසන ලදී.

## <u>04.යථාපරිදි කල්දි ඇති ප්‍රශ්න.</u>

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## <u>05.යථාපරිදි කල්දි ඇති යෝජනා.</u>

## 05.01.<u>ගරු මූලාසනයේ යෝජනා.</u>

## <u>05.01.01.2026 වර්ෂයේ කෙටුම්පත් අයවැය වාර්තාව සම්මත කිරීම හා සම්බන්ධවයි.</u>

2020 .10. 29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ රීති අංක 10(1) ට අනුව සෑම වර්ෂයකම නොවැම්බර් මස 15 දිනට පෙර සභාපති වරයා විසින් සුදුසු යැයි උපකල්පනය කරන යම් දිනකදී ඊළඟ වර්ෂය සඳහා වන කෙටුම්පත් අයවැය ලේඛනය අවසාන වශයෙන් සලකා බලා සම්මත කරගත යුතුය. එබැවින් 2026 වර්ෂයේ කෙටුම්පත් අයවැය සම්මත කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපතිතුමාගේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම.</u>

2025 වර්ෂයේ  ජූනි මස 02 වන දින  බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස මා තේරී පත්වූ අතර මෙසේ බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපති  ධූරයට පත්වීම   පිළිබඳව මා ඉතාමත් සංතෘප්තියට පත්වන 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතින් මා හට ලද  බලතල ප්‍රකාරව ඉටුකල  යුතු කාර්යයන් හා වගකීම් ඉටුකිරීමට කැපවෙමින්  බිබිල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්  ඔහුන්ගේ ජීවන උන්නතිය සංවර්ධනය සඳහා  හැකි උපරිම ආකාරයට දායක වෙමින් කටයුතු කිරීමට හදවතින්ම කැපවෙමි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභාවේ විධිවිධාන වලට අනුව දියුණුකල ප්‍රදේශවලින්  වරිපනම් බදු අයකර ප්‍රදේශයේ සංවර්ධන කටයුතු  කිරීමට බලාපොරොත්තු වන අතර දරිද්‍රතාවය තුරන් කිරීමේ ක්‍රියාවලිය යටතේ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් සේ සැලකිය හැකි බිබිල සතිපොළෙහි කඩකාමර ඉදිකිරීම් කටයුතු සාර්ථකව නිමාකිරීමෙන් පසුව  එය ව්‍යාපාරික මධ්‍යස්ථානයක් බවට පත්කරමින් මහජනතාවට රැකියා අවස්ථා සඳහා පවතින වෙළඳපළ පරාසය පුළුල් කරමින් රැකියා අවස්ථා උදාකරමින් ඔහුන්ගේ ජීවන තත්වය උසස් මගකට යොමු කිරීමට හා කැපවෙමි.

තවද බිබිල නගරය නව ව්‍යාපාරික මං පෙතකට අවතීර්ණය වීමට  හා මහජනතාවට , පාරිභෝගිකයින්ට සහා ව්‍යාපාරිකයින්ට පහසුවෙන් හා උපරිම යටිතල පහසුකම් යටතේ තම දෛනික ජීවනෝපාය කරගෙන යාමට නිදහස් පරිසරයක් ගොඩනගමි.වර්තමානයේදී පවතින ජල ව්‍යාපෘති පිළිබඳව සොයා බලා ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් මහජනතාවට අපහසුවකින් තොරව විධිමත්ව හා අඛණ්ඩව ජලය පරිහරණය කිරීමටද අවශ්‍ය කටයුතු සූදානම් කරමින් 2026 වර්ෂයේදී බිබිල ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍ර සූත්‍ර ඉතා කාර්යක්ෂම හා සඵලදායි ලෙස  විධිමත් ආකාරයට සේවා සැපයීමට යොදාගනිමින් එම සේවා සැපයීම හරහා උපයාගන්නා ලද ආදායම් මත තව තවත් ආයෝජන පරාශයන් පුළුල්කරගැනීමටත් බිබිල ප්‍රාදේශීය සභාව සතු අනෙකුත් වත්කම් ද ඌන උපයෝජනයකින් තොරව භාවිතා කිරීමෙන් ශක්තිමත් ස්වයං උත්පාදිත ආදායමක් රැස්කරගැනීමටත් නිරතුරුව කටයුතු කරමි.

තවද ස.තො.ස ගොඩනැගිල්ල පළමු මහළ සකස් කිරීමට මූලික පියවර ගැනීමත් , රථ වාහන සර්විස් කිරීමේ අංගනය ටෙන්ඩර් කිරීම මගින් සභාවේ ස්වයං උත්පාදිත ආදායම ශක්තිමත් කර ගැනීමටත් බිබිල ප්‍රාදේශීය සභා ආදාහනාගාරය මගින් ලබා දෙන විධිමත් සක්‍රීය සේවාව තුළින් බල ප්‍රදේශය තුළ මෙන්ම පිටත බල ප්‍රදේශයද වැඩි වශයෙන් පුළුල් කර ගැනීමට අපේක්ෂා කරමි.

පොදු උපයෝගීතා සේවා මෙන්ම සමාජ සුබසාධක සේවා වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රදේශයේ පවතින අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශ හා එක්වෙමින් නිරන්තරයෙන් බිබිල ප්‍රදේශයේ ජනතාවගේ ගැටළු හා අර්බුධකාරි තත්වයන් හදුනා ගනිමින් ද  පරිපූර්ණ ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරාවට ඉගෙනීමේ අවස්ථාව සැලසීම සඳහා බිබිල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය තෝතැන්නක් කිරීමේ පරාශය පුළුල් කිරීමේ අපේක්ෂාවෙන් නව කෘති මිලදී ගැනීමට 2026 වර්ෂයේදී ද  ප්‍රාග්ධන වියදම් යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ප්‍රදේශයේ දූවාදරුවන්ගේ  අධ්‍යාපනය, දැනුම හා ආකල්ප ඉහල නැංවීම සඳහා බිබිල මහජන පුස්තකාලය මහත් රුකුළක් වන අතර "සාහිත්‍ය මාසය"මූලික කරගනිමින් විවිධ වූ සාහිත්‍ය වැඩ සටහන් පැවැත්වීමටත් අවශ්‍ය කටයුතු සූදානම් කිරිමට ඉදිරි වසර තුළ මා වෙහෙස දරමි.

රටේ අනාගතය පෝෂණය කිරීමට සිටින්නා වූ පුංචි දූවාදරුවන් වෙනුවෙන් පවතින පූර්ව ළමාවිය කෙරෙහි දැඩි අවදානයක් යොමුකරමින් ඒ සඳහා හිහව පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හරහා  වඩා සුරක්ෂිත,ආදර්ශවත් හා යහපත් ගුණදායි අධ්‍යාපන පරිසරයක් නිර්මාණය කිරීමටත් අපේක්ෂා කරමි.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා බිබිල පොලීසිය සමග සම්බන්ධ වෙමින් පාසල් දරුවන්ගේ අනාගතය උදෙසා ඔවුන්ගේ මනස පෝෂණය කරමින් රටට වැඩදායි අනාගත පරපුරක් නිර්මාණය කිරීමේ අදිටනින් මත්ද්‍රව්‍ය නිවාරණය හා කසලින් තොර ප්‍රදේශයක් නිර්මාණය කිරීම වෙනුවෙන් කසළ කළමනාකරණය සඳහාද අවශ්‍ය  ප්‍රතිපාදන වෙන්කරමින් විශාල සේවයක් ඉටුකිරීමට අපේක්ෂා කරමි.

බිබිල ප්‍රාදේශීය සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව මගින් ප්‍රදේශයේ බොහෝ ජනතාවට සහනය සලසන අතර 2026 වර්ෂයේදී ආයුර්වේද බෙහෙත් ශාලාවට ඖෂධ මිලට ගැනීම සඳහා ලක්ෂ 10 පමණ ප්‍රතිපාදන වෙන්කරමින් ඒ හරහා ප්‍රදේශයේ මහජනතාවට විශාල සේවයක් ඉටුකිරීමට අපේක්ෂා කරමි.

දෛනික ජීවනෝපාය සඳහා බාධාවක්ව පවතින ග්‍රාමීය කොට්ඨාසවල පවතින මාර්ග පද්ධතිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් නගරයට පැමිණිමට පහසුවන ආකාරයට අබලන්ව පවතින මාර්ග හා බෝක්කු ප්‍රතිසංස්කරණය කිරීමටත්, ජලය , විදුලිපහන් නඩත්තු කිරීම් සඳහා වැඩි අවධානයක් යොමු කිරීමටත් එමගින් ලෝක ප්‍රවණතාවක්ව පවතින සහස්‍ර සංවර්ධන අරමුණු කරා ලගා වීමට දායකත්වයක් සැපයීමටත් අපේක්ෂා කරමි.

මෙසේ මාගේ උපරිම ශක්තිය හා කැපවීම තුලින් බිබිල නගරය පූර්ණ ආරක්ෂිත සවිමත් නගරයක් බවට පත්කිරීමටත් ඉදිරි ධූර කාලය තුල බල ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීමට කාර්ය මණ්ඩලයේත් අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලත් සියළුම බාහිර ප්‍රජා පාර්ශවයන්ගේ සහයෝගය නොමඳව අපේක්ෂා කරන බවත් බිබිල ප්‍රාදේශීය සභා සභාපති ලෙස මෙම ගමනට පියවර තැබීමට මා හට සහයෝගය දැක්වූ සියළුම රාජ්‍ය ආයතනවල නිලධාරීන්ටද රාජ්‍ය නොවන ආයතන වලටද බලප්‍රදේශයේ සියළුම මහජනතාවටද මාගේ හදපිරි ස්තූතිය පුදකරමි.

**<u>2026 කෙටුම්පත් අයවැය සාරාංශය ඉදිරිපත් කිරීම.</u>**

| | |
|---|---|
| අපේක්ෂිත මුළු ආදායම | 168,919,733.96 |
| අපේක්ෂිත මුළු වියදම | 145,653,080.00 |
| | 23,266,653.96 |
| ප්‍රාග්ධන ආධාර ලැබීම් | (16,000,000.00) |
| සභා අරමුදලින් ප්‍රාග්ධන වියදම් දැරීමට ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය | 7,266,653.96 |
| දේශීය ණය වාරිකය ගෙවීම (ප්‍රාග්ධන කොටස) | (358,046.58) |
| ප්‍රාග්ධ වියදම්/සංවර්ධන කටයුත් සඳහා වෙන්කිරීමට ඇති ප්‍රමාණය (සභා අරමුදල්) | 6,908,607.38 |

| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම. (16 000 000+6 908 607.38) | | 22,908,607.38 |
|---|---|---|
| 109 - පොදු පරිපාලනය | කාර්යාල උපකරණ මිලදි ගැනීම | 400,000.00 |
| 209- සෞඛ්‍ය සේවා | සෞඛ්‍ය උපකරණ මිලදී ගැනීම | 100,000.00 |
| 309- භෞතික සැලසුම්, මං මාවත්, ඉඩම් හා ගොඩනැගිලි | මාර්ග සංවර්ධන කටයුතු (8 000 000.00+3 000 000.00) | 11,800,000.00 |
| | | |

| | | |
|---|---|---|
| 509-පොදු උපයෝගිතා සේවා | නළ ලිං/බෝක්කු/ පොදු වැසිකිලි/ ආදායම් උත්පාදිත ගොඩනැගිලි ආදි පොදු උපයෝගිතා සේවා ( 8 000 000.00+ 1 900 000.00) | 10,050,000.00 |
| 609-සුබ සාධක සේවා | පුස්තකාල පොත් ලබා ගැනීම | 480,000.00 |
| | කාර්යාල උපකරණ මිලදී ගැනීම (පෙර පාසල් /පුස්තකාල) | 78,500.00 |
| **අතිරික්තය** | | **107.38** |

**<u>අයවැය සංශෝධන පිළිබඳ ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කිරීම.</u>**
කිසිවක් ඉදිරිපත් වී නොමැත.

2026 අයවැය යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**<u>ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා අදහස් දැක්වීම.</u>**

තමා වෙත ලැබී ඇති 2026 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කෙටුම්පත් අයවැය ප්‍රකාශයෙහි පැහැදිලි පිටපතක් නොවන බැවින් මෙම අයවැය සම්මත කිරීමට තමාට පෞද්ගලිකව කළ නොහැකි බවත් අයවැයෙහි 1.0 පොදු පරිපාලන 1-43 (ii) හි

සභාව සතු සුසාන භූමිවල මෘත දේහ තැම්පත් කිරීම - 10000.00*3*12
මෘත දේහ ආදාහනය කිරීමේ ගාස්තු බල ප්‍රදේශය තුළ - 9500.00*3*12
බල ප්‍රදේශයෙන් පිට දේහ ආදාහනය කිරීමේ ගාස්තු - 10500.00*5*12
භෂ්මාවශේෂ තැම්පත් කිරීම (මල් බඳුනක) - 6000.00*3*12
භෂ්මාවශේෂ තැම්පත් කිරීම (සුසාන භූමියේ අඩි 1 ½* 1*1/2 වලක) - 3000.00*3*12

ලෙස ඉදිරිපත් කර ඇත. මන්ත්‍රී මණ්ඩලය විසින් මෙම මුදල් ගුණ කිරීම් සිදුකර මුළු මුදල සොයා ගෙන එකතු කිරීම් කර 2026 වර්ෂයට අදාළ ඇස්තමේන්තු වන රු.1,800,000.00 ක මුදල සොයා ගත යුතුය. නිළධාරීන්ගේ කම්මැලිකම නිසා මෙවැනි ක්‍රියාවන් කරන බව ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා පැවසීය. ඇස්තමේන්තුගත මුදලද ඡායා පිටපතෙහි පැහැදිලිව නොපෙනෙන බවත් එබැවින් මන්ත්‍රී මණ්ඩලයට ඒවා සම්පූර්ණ එකතු කිරීම් කිරීමට සිදුවන බවද පැවසීය.

මෙම කෙටුම්පත් අයවැයෙහි 309, 509 ශීර්ෂ යටතේ ආදායම් උත්පාදන කිරීම් පුම්බා හුවා දැක්වුවද එම ආදායම උත්පාදනය කළ හැකි දැයි ගැටලු පවතී. නිතර දරුවන්ගේ අධ්‍යාපනය ආදිය පිළිබඳව කතා කළද පෙර පාසල සඳහා ළමුන් ඇතුළත් කිරීමේ අයදුම්පතු ගාස්තු රු.100.00ක් ලෙස අයකරනු ලබයි. මෙම දරුවන් ඇතුළත් කිරීමේදී අවශ්‍ය පොත්පත් ආදිය මිලදී ගැනීම සඳහා විශාල මුදලක් වැයවන අවස්ථාවක මෙම පෙර පාසල් දරුවන්ගෙන් අයදුම්පත්‍ර ගාස්තු අයකිරීම සුදුසු නොවන බවද පැවසීය.

2.0 සෞඛ්‍ය සේවා යටතේ සේවා සඳහා ගාස්තු 2-43 (i) යටතේ ගලි බවුසරය කුලියට දීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත ආදායම වන රු.1,500,000.00 ක මුදල ලබා ගැනීමට හැකිද? 2022 වර්ෂයේ සිට සත්‍ය ආදායමට අනුව ගලි බවුසරය කුලියට දීමෙන් ලබන ආදායම වැඩි වීමට නම් උතුරනු ලබන ගලි ප්‍රමාණය වැඩිවිය යුතුය. එබැවින් මෙම ඇස්තමේන්තුව සාධාරණ ඇස්තමේන්තුවක් නොවන බව පැවසීය. 2.42 (x) ආයුර්වේදයේ රුධිර සීනි පරීක්ෂාව මඟින් 2022 වර්ෂයේ සිට ලැබූ ආදායම අනුව බලන විට 2026 වර්ෂය සඳහා ආදායම රු.18,000.00 ක මුදලක් ඉපයීම පෙන්වීම ආදායම අයි

තක්සේරුවකින් පෙන්වීමකි. මෙම අයවැය මඟින් ආදායම උත්පාදනය කළ හැකි බව පෙන්වුවද ප්‍රායෝගිකව මෙම වියදම් පියවා ගැනීමට ආදායම් උත්පාදනය කරගත හැකිද? යන්න ගැටලු සහගතය.

309 භෞතික සැලසුම් ,මංමාවත්,ඉඩම් හා ගොඩනැඟිලි යටතේ මාර්ග සංවර්ධන කටයුතු සඳහා රු.11,800,000.00 මුදලක් වෙන් කර ඇති බවත් 509 පොදු උපයෝගීතා සේවා යටතේ නළ ළිං, බෝක්කු , පොදු වැසිකිළි, ආදායම උත්පාදිත ගොඩනැගිලි ආදී පොදු උපයෝගීතාවන් සඳහා රු.10,050,000.00 මුදලක් වෙන් කර තිබෙන බවත් සහා අරමුදලින් වැය කර මංමාවත් සංවර්ධනය කරගත හැකි බවට ගරු මන්ත්‍රී මණ්ඩලයට සතුටු විය හැකි වුවත් මෙම ආදායම් උත්පාදනය කළහැකි වේදැයි ගැටලුවක් පවතී.

1.0පොදු පරිපාලන වියදම් 101-4 වෙනත් ගෙවීම් යටතේ රු.400,000.00 යටතේ මුදල් වෙන් කර තිබෙන බවත් මන්ත්‍රීවරුන් සඳහා මෙම කම්ටු දීමනා ගෙවා තිබෙනවාද? ඉදිරි වර්ෂයේදී ගෙවන්නේද යන්න සලකා බැලියයුතු කරුණක් බවයි. 105-4 යටතේ සංග්‍රහ වියදම් 2026 වර්ෂයට අදාලව රු.150,000.00 ක මුදලක් වෙන් කර ඇති බවත් ඒ තුළ මන්ත්‍රීවරුන්ගේ සංග්‍රහ වියදම් ද එම සංග්‍රහ වියදම තුළ ඇතුළත් වන බවත් පෙර වර්ෂ සමඟ සංසන්දනය කරන විට 50%ක් අඩු කර තිබෙන බවත් පැවසීය.

මෙම සභාවේ මන්ත්‍රී මණ්ඩලය ඉදිරි වර්ෂ 04ක කාලසීමාව තුළ බිබිල කොට්ඨාසයේ වසම් හතලිහේම (40) ජනතාවට බිබිල ප්‍රාදේශීය සභාව මඟින් ඉටු කළයුතු ඉටු කිරීමට බැඳී ඇති වගකීම් සම්භාරය ඉටුකිරීම සඳහා කටයුතු කළයුතු බැවින් මෙය ගෞරවනීය සභාවක් වියයුතුය. මන්ත්‍රීවරුන් ගමට ගොස් කතා කිරීමේදී මන්ත්‍රීවරුන් ලෙස පෞර්ෂයක් තිබිය යුතුය. මෙම මන්ත්‍රී මණ්ඩලයේ වැඩි පිරිසක් විශ්‍රාමික ගුරුවරු,රාජ්‍ය සේවකයින් ,පිළිගත් ව්‍යාපාරිකයින් සිටියි. සම්භාවනීය මන්ත්‍රී මණ්ඩලයක් තුළ කටයුතු කිරීමේදී මන්ත්‍රීවරයාගේ ගෞරවය, අභිමානය, පෞර්ෂය ආරක්ෂා විය යුතුය. මෙම සංග්‍රහ වියදම මඟින් ප්‍රාදේශීය සභාව දවසට පමණක් හෝ මන්ත්‍රී මණ්ඩලය සඳහා සංග්‍රහ වියදමක් දැරිය යුතු බවත් මීට පෙර පැවති ප්‍රාදේශීය සභාවන් වල මෙම ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රීවරුන්ට හා නිළධාරීන්ට සංග්‍රයහයක් පැවැත් වූ බවත් අනෙකුත් ප්‍රාදේශීය සභවල සභාව පවත්වන දිනයන්හි දැනටමත් සංග්‍රහ ලබාදෙන බවත් පැවසීය. මෙම ප්‍රාදේශීය සභාව තුළ වතුර වීදුරුවක් තබා වතුර නිතර පුරවමින් කටයුතු කිරීම එම සේවක මහත්මියට මෙන්ම මන්ත්‍රී මණ්ඩලයට අපහසු බවත් එය ගෞරවනීය සභාවකට සුදුසු නොවන බවත් , මන්ත්‍රී මණ්ඩලයේ සුභසාධන වියදම් කපා හැර ඇති බවත් පැවසීය.

මන්ත්‍රී මණ්ඩලයට අසුන් ගෙන සිටීමට වෙන් කර ඇති විවේකාගාරය පිළිවෙලට සකස් කර නොතිබූ බවත් එම ස්ථානයේ අද දින නිළධාරියෙක් රාජකාරියේ නියුක්තව සිටි බවද පැවසූ මන්ත්‍රීවරයා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට සාකච්ඡා කර තීන්දු , තීරණ, යෝජනාවන් කිරීමට තිබෙන ස්ථානය පවා පහසුකම් සහිතව ලබා නොදී ඇති බව පැවසූ අතර මෙම විවේකාගාරය පිළිවෙලට සකස් කර තිබිය යුතු බව පෙන්වා දෙන ලදී. දිගු කාලයක් තමා මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන බවත් මන්ත්‍රී මණ්ඩලය සඳහා හාෆ්සීට්, ලිපිගොනු කවර , පෑන් ,A4 කොළ ,අඩි රූල් , ලියුම් කවර ආදී ලිපි ද්‍රව්‍ය ලැබුණු බවත් මේ වන විට ඒවා ලබා නොදෙමින් එම වරප්‍රසාදයද මන්ත්‍රී මණ්ඩලයට කපාහැර ඇත. තමාට මීට පෙර 2022 වර්ෂයේදී ලබාදුන් ලියුම් කවර දැනටත් තිබෙන බවත් කොට්ඨාස මට්ටමින් සංවර්ධන කටයුතු කිරීමේදී ලිපිද්‍රව්‍ය අවශ්‍ය වන බවත් දැනට පෞද්ගලික වියදමින් ලිපිද්‍රව්‍ය සපයා ගන්නා බවත් පැවසීය. මන්ත්‍රී වරුන් වෙනුවෙන් ලබා දෙන සුභ සාධන වියදම් මෙම අයවැය සඳහා ඇතුළත් කිරීමට හැකි නම් ඇතුළත් කර මන්ත්‍රී මණ්ඩලය සඳහා ලබා දෙන ලෙස ගරු මූලාසනයෙන් ඉල්ලා සිටින ලදී.

ලිපිද්‍රව්‍ය පහසුකම් ලබා නොදීම, ගෞරවනීය ලෙස සභාවෙහි හිඳගෙන තේ එකක් බීමට අවස්ථාවක් නොමැතිවීම, වැසිකිලි පහසුකම් නොමැතිවීම, ජල පහසුකම් නොමැති ආදිය පෙන්වා දුන් අතර නිළධාරීනගේ අඩුපාඩුද පෙන්වා දියයුතු බවත් මන්ත්‍රීවරුන් ලෙස එසේ පෙන්වා නුදුනහොත් ඒ අයද අකාර්යක්ෂම වන බව පැවසීය.මන්ත්‍රීවරුන්ගේ ගෞරවය,පෞර්ෂය රැකෙන ආකාරයට සභාව තුළ පිළිගැනීමක් ඇති කළයුතු බව පැවසීය.

මෙම අයවැය සඳහා ලස්සන පිටකවරයක් දමා සාදා ඉදිරිපත් කළහොත් ලස්සන අයවැයක් ලෙස කිවහැකි වුවත් සභාව සඳහා ආදායමක් ලැබේ නම් මෙම වැය ශීර්ෂ වෙනස් කරමින් හෝ ජනතාවගේ සුභ සිද්ධියට වියදම් කළහැකි බවත් එසේ ආදායම් උත්පාදනය කළ නොහැකි අයවැයක් බවත් තිබූ එකම ඉතුරුම් ආදායම වූ ස්ථාවර ගිණුමෙහි මුදල් ලබා ගෙනද ඉන්ධන ණය පියවූ බව පැවසීය. වියදම් පියවා ගැනීමට නම් ආදායම් උත්පාදනය කළයුතු වුවත් මෙම අයවැයෙහි නව ආදායම් උත්පාදන ව්‍යාපෘති කිසිවක් ඇතුළත් වී නොමැති බවත් තිබෙන ආදායම ම පමණක් ඇතුළත් වී ඇති බවත් වරිපනම් පහසුකම් වැඩි කර වරිපනම් ආදායමවත් වැඩි කර ගැනීමට කටයුතු කර නොමැති අයවැයක් බව පැවසීය.

එම අවස්ථාවේ ගරු මූලාසනය විසින් රදලියද්ද ආදාහනාගාරය නව ආදායම් උත්පාදන මාර්ගයක් යැයි පැවසූ විට ගරු එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් එය පෙර පැවති ප්‍රාදේශීය සභාව මඟින් ඉදිකළ බව පැවසූ අතර 2025 වර්ෂයේ ජාතික ජනබලවේග පළාත් පාලන සමයෙහි සභා අරමුදලින් මෙම රදලියද්ද ආදාහනාගාරය වෙනුවෙන් වැයකළ මුදල කොතරම් ද? යැයි ප්‍රශ්න කළ අතර ඉදිරියේදී යථා පරිදි කලිදී ඇති ප්‍රශ්න යටතේ තමා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරන බවද වැඩිදුරටත් පැවසීය. සතොස ගොඩනැඟිල්ල ඉදිකර එමඟින් ආදායමක් උත්පාදනය කළ හැකි බවත් පහසුකම් වැඩිකර වරිපනම් සීමාවන් වැඩිකර ආදායම් උත්පාදනය වැඩිකර ගත හැකි බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා වියදම් දැරීමට නම් ආදායම් උත්පාදනය කළයුතු බවත් ආදායම් උත්පාදන මාර්ග කිසිවක් මෙම අයවැයෙහි අන්තර්ගත නොවන බවත් ලැබුණු ආදායම් පමණක් මෙම අයවැය සඳහා අන්තර්ගත වී ඇති බවත් එයත් අධි තක්සේරුවකින් ඉදිරිපත් කර ඇති බවත් පවසන ලදී.

පළාත් පාලන මැතිවරණ සමයෙහි ගෙන් ගෙට ගොස් බෙදූ පත්‍රිකා වල පානාවල දර්ශනීය ස්ථානයක් කිරීම, කොටගම බලාගාරය සංචාරක මධ්‍යස්ථානයක් කිරීම ලෙස සංවර්ධන යෝජනා ඉදිරිපත් කර තිබුණද මෙම මංගල අයවැයෙහි කිසිදු එවැනි ව්‍යාපෘතියක් ඉදිරිපත් කර නොමැති බව පැවසීය. මාර්ග සංවර්ධනය සෑම වසරකම සිදුකරනු ලබන ව්‍යාපෘතියක් බවත් මෙම මොටර් ග්‍රේඩර් කළ මාර්ග වැසි සමය එළඹෙත්ම මඩ වී සේදී යාම හේතුවෙන් ගමන් කිරීමට නොහැකි ලෙසම අබලන් වන බවත් පැවසීය. මෙම මාර්ග සංවර්ධනය කළයුතු ආකාරය පිළිබඳව පෙර පැවති සභාවකදී තමාද අදහස් ඉදිරිපත් කළ බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා ජාතික ජනබලවේග ආණ්ඩුවෙන් කොන්ක්‍රීට් කළ මාර්ග කැඩී ගොස් ඇති බවත් පැවසීය.

මෙම මාර්ග සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත් සමිති මඟින් ලබා ගත්තද එමඟින්ද පුද්ගලයකු කොන්ත්‍රාත් ලබා ගෙන වැඩ කරනු ලබන බැවින් ඒ අයගේ ක්‍රියා කලාපය නිසා මෙසේ සිදුවනවා වන්නට පුළුවන් බවත් පැවසීය. ජාතික ජනබලවේගයට ඡන්දය ලබාදී ඇත්තේ සමගි ජන බලවේගය, පොදුජන පෙරමුණ ආදී අනෙකුත් සියළු පක්ෂ වලට ඡන්දය ලබාදුන් පුද්ගලයින් බවත් පවසාලීය. මීට පෙරද මොටර් ග්‍රේඩරය මඟින් JCB මඟින් මාර්ග කැපූ බවත් මාර්ග සංවර්ධනය කළ බවත් එම කිසිදු කටයුත්තක් face book මගින් ෆොටෝ ප්‍රදර්ශනය කරමින් විශාල ප්‍රසිද්ධ කිරීම් නොකළද මෙම ආණ්ඩුව මඟින් ෆෝටෝ ප්‍රදර්ශනය කරමින් ප්‍රසිද්ධවීමට උත්සාහ කරන බව පැවසීය. මෙම අයවැයෙහි කිසිදු ආදායම් උත්පාදන මාර්ගයක් ඇතුළත් නොවූ ඉලක්කම් පොතක් බවත් පැවසීය. 2022 වර්ෂයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුද අයවැයට විරුද්ධව ඡන්දය ලබාදී අයවැය පරාද වූ බවත් සියළුම මන්ත්‍රීවරුන් නිවැරදි දේ නිවැරදිව දැකීම සුදුසු බව පැවසූ අතර මෙම අයවැය සතුටු වියයුතු අයවැයක් නොවන බව පැවසීය.

2026 කෙටුම්පත් අයවැය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙකු සංශෝධන ඉදිරිපත් කර නොමැත. එබැවින් සියළු දෙනා තමාගේ අදහස් විනාඩි පහක වැනි කෙටි කාලයක් තුළ තමාගේ අදහස් ඉදිරිපත් කිරීමට කාරුණික වන ලෙස ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.</u>

2026 වර්ෂය සඳහා ඉදිරිපත් කළ කෙටුම්පත් අයවැයෙහි මුද්‍රණ දෝෂ තිබුණද ඒ පිළිබඳ සාධණීය විවේචනයක් නොවූ බව පැවසූ මන්ත්‍රීවරයා මෙම ඇස්තමේන්තුගත අයවැය අතිශය සුභවාදී අයවැයක්

බවත් ජනාධිපතිතුමාගේ සිට සියළු දෙනාගේ අපේක්ෂාව වන්නේ පොහොසත් රටක සතුටින් ජීවත්වන ජනතාවක් බිහි කිරීමයි. එම අපේක්ෂාව වෙත ගමන් කිරීමේදී පළාත් පාලන ආයතනයක් ලෙස බිබිල ප්‍රාදේශීය සභාවේ ඇස්තමේන්තුගත අයවැය අභියෝගාත්මක අයවැයක් ලෙස සැලකිය හැකි බවත් . මේ වනවිට ආදාහනාගාරය තුළින අපේක්ෂා නොකළ ආදායමක් ලැබෙන බවත් එක් මාසයකදී මෘත මෘත ශරිර 16 ක් ආදාහනය සිදු කරමින් ආදායම් උත්පාදනය කර ඇති බවත් පැවසීය. මෙම ආදාහනාගාරය සඳහා ලුණුගල ,පදියතලාව, රිදීමාලියද්ද යන ප්‍රදේශවලින්ද ආදාහනාගාරය වෙත මෘත දේහ රැගෙන එන අතර අපේක්ෂා නොකළ ලෙස ආදායමක් උත්පාදනය කිරීමට හැකිව ඇති බවත් 2026 කෙටුම්පත් අයවැය දෙස සුභවාදීව බලා අභියෝග භාර ගෙන එය යථාර්ථයක් බවට පත් කර ගැනීමට කටයුතු කරමු යැයි පැවසූ ගරු මන්ත්‍රීතුමා සංග්‍රහ වියදම් සඳහා මුදල් වෙන් කර ඇත්තේ ඉදිරි වර්ෂයේදී සංග්‍රහ වියදමක් දැරීමට සිදුවුවහොත් ඒ සඳහා වැය කිරීමට මුදල් වෙන් කර තිබිය යුතු බැවින් වෙන් කළ බවයි. ජාතික ජනබල වේගය ප්‍රමුඛ කර ගත් බිබිල ප්‍රාදේශීය සභාවෙහි මෙම අයවැය අනුව කටයුතු කර 2026 වර්ෂය සාර්ථකත්වය කරා ගමන් කර අභිමානවත් ගමනක් යන්නට සිහළු පක්ෂවලට එක් වන ලෙස ආරාධනා කරමින්බිබිල ප්‍රාදේශීය සභාව ආදර්ශවත් ප්‍රාදේශීය සභාවක් කරමු යැයි ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා අදහස් දැක්වීම.</u>

සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ 2026 වර්ෂය සඳහා කෙටුම්පත් අයවැය ඉතා වටිනා අයවැයක් වන අතර බිබිල නගරය පැරණි නගරයක් බවත් නව්‍යතාවයකින් දියුණු වෙමින් පවතින නගරයක් බැවින් උපකල්පනය කළ ආදායම් ඉපයීමට හා වියදම් දැරීමට හැකි වේවා යැයි පතන බවත් ගම්වල සංවර්ධන කටයුතු ඉටුකර ගතහැකි ඉතා වටිනා අයවැයක් බවත් උපකල්පනය කරනු ලබන ආදායම මගින් වියදම් පියවා ගනිමින් කටයුතු කළහැකි අයවැයක් යැයි විශ්වාස කරන බවත් පැවසීය.

සංවර්ධන කටයුතු ගමට ගෙන යාමේදී , නගරය කේන්ද්‍ර කරගෙන ගමේ ජනතාව වෙළඳාම් කටයුතු කිරීමට, බෙහෙත් ගැනීමට , අධ්‍යාපන කටයුතු වැනි අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා නගරයට ඒම සඳහා මාර්ග පද්ධතිය සකස් කිරීමට ගම්වල මාර්ග සංවර්ධනය කිරීමට ගරු සභාපතිතුමා උත්සාහයක යෙදුණු බවත් වර්ෂා කාලය එළඹුණු හෙයින් දැනට එම මාර්ග ඉදිකිරීම නවතා ඇති බවත් පැවසීය. මෙම අයවැය තුළින් ඉදිරියේදී මාර්ග සංවර්ධනය, පෙර පාසල් සංවර්ධනය, පොළ භූමි සංවර්ධනය, පොදු උපයෝගිතා සේවා සංවර්ධනය කිරීම ආදී දියුණු කිරීම් කිරීමට මෙම අයවැය තුළින් ඉටු කර ගත හැකි යැයි විශ්වාසය තිබෙන බව පැවසූ අතර මෙම උපකල්පනය කරනු ලබන ආදායමින් වියදම් පියවාගෙන සංවර්ධන කටයුතු කිරීමට හැකි වෙතැයි උපකල්පනය කරන බව පැවසූ අතර පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගතකිරීම සඳහා මෙම 2026 කෙටුම්පත් අයවැය මගින් ඉටු කර ගැනීමට සියළු දෙනා එකතු වී සොයා බලා කටයුතු කරමින් මෙම අයවැය සාර්ථක කරගෙන බිබිල සුරපුරයක් කරමු යැයි පවසන ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා අදහස් දැක්වීම.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂයේ කෙටුම්පත් අයවැය ඉතා සාධනීය අයවැයක් ලෙස පැවසූ අතර දශක තුනක වැනි කාලයක් තමා දේශපාලන කටයුතුවල නියුතු වී සිටින බවත් පාර්ලිමේන්තුව, පළාත් සභාව, නගර සභාවල විපක්ෂයේ කිසිදු පක්ෂයක් අයවැය සුභවාදී ලෙස නොදකින බවත් ඒ අය ආණ්ඩු පක්ෂයේ සිට ඉදිරිපත් කරන අයවැය පමණක් නිවැරදි අයවැයක් ලෙස දකියි. මෙය ලංකාවේ නිවැරදි කළ නොහැකි තත්වයක් බව පැවසීය.

මෙම ආණ්ඩුව රට භාර ගන්නා විට බංකොලොත් වූ රටක් භාරගත් බවත් එතැන් සිට ඉන් මුදවා ගනිමින් ටිකින් ටික සංවර්ධනය කරා ගමන් කිරීමට ගරු ජනාධිපතිතුමා ඇතළු සියළු දෙනා කටයුතු කරමින් සිටින යුගයක් ලෙස මෙම කාල සීමාව හඳුන්වා දෙන ලදී. ගරු තිස්ස මන්ත්‍රීතුමා විසින් ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඉදිරිපත් කර තිබූ සංවර්ධන යෝජනා මෙම අයවැයෙහි ඉදිරිපත් කර නොමැති බව පැවසුවද එම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ දක්වා ඇත්තේ අවුරුදු 04ක කාලසීමාවක් තුළ සංවර්ධනය කිරීම්

බවත් මෙම මංගල අයවැයෙහි ඇතුළත් නොකළද ඉදිරි වර්ෂවල අයවැය සඳහා ඉදිරිපත් කරන බවත් සියළුම සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමට නම් ශ්‍රී ලංකාව සංවර්ධිත දියුණු රටක් වියයුතු බව පැවසීය.

කොටගම බලාගාරය සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කිරීම පිළිබඳව ගරු මන්ත්‍රී තිස්ස ගුණසිංහ මැතිතුමා විමසා සිටි බවත් මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ එක්ව සංචාරක අමාත්‍යංශය යටතේ බලාගාර කොටස සංවර්ධනය කිරීමට 2026 වර්ෂයේ මුල් කාර්තුවේ සිදු කිරීමට කටයුතු කරන බවත් පැවසීය. මෙම බලාගාර මාර්ගය ඉදිකිරීමට මිලියන 2ක මුදලක් ලැබුණු අතර එම මුදල විශේෂිත වැඩසටහනකට යොමු කළ බවත් සියළු දෙනාම සෑම කටයුත්තක් දෙසම අවතක්සේරුවෙන් බැලීමට කටයුතු නොකරන ලෙසත් වංචා , දූෂණ වලින් පිරුණු රටක් තිබූ බවත් මේ වන විට එම තත්වයන් පැහැදිලිව ජනතාවට දැකිය හැකි බවත් මෙම ආණ්ඩුව පත් නොවූවා නම් අනාගත පරපුරට රටක් ඉතිරි නොවන බවත් මේ යන ගමනට සියළුම දෙනා සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දැක්වීම.</u>

දින තුනකට පෙර අයවැය සංශෝධන ලබා දෙන ලෙස දන්වා සිටියද 2026 වර්ෂයේ අයවැය පිළිබඳ මීට පෙර දිනක සාකච්ඡාවක් කරමින් සංශෝදනය කළයුතු දේවල් සාකච්ඡා කළ බව පැවසීය. මස්කඩ හා මාළු කඩ වලින් හා ටෙන්ඩර් කළහැකි කඩවලින් ලැබෙන ආදායම මගින් අයවැයෙහි ආදායම උත්පාදනය වුවද මස් මාළු කඩ ටෙන්ඩර් නොවුන හොත් සභාවට කිසිදු ආදායමක් නොලැබෙන බවත් සභාව සතු සුසාන භූමිවල මෘතදේහ තැම්පත් කිරීමට රු.10,000.00ක මුදලක් අය කරන බවත් , 1 ½ *1 ½ වලක භස්මාවශේෂ තැම්පත් කිරීම සඳහා රු.3000.00ක මුදලක් ද, මල් පෝච්චියක භස්මාවශේෂ තැම්පත් කිරීම සඳහා රු.6000.00 ක මුදලක්ද ,6*4 කොන්ක්‍රීට් වලක මෘත දේහ තැම්පත් කිරීම සඳහා රු.10,000.00ක මුදලක් අය කිරීමට කෙටුම්පත් කළද මේ සඳහා රු. 50,000.00ක මුදලක් වත් අය කිරීමට සුදුසු බවත් අඩුම රු.25,000.00ක මුදලක් වත් අයකිරීමට කෙටුම්පත් කිරීම සුදුසු බවයි.

තමා පරිසර කමිටුවේදී පොළ භූමියේ ඉදිරියේ ඇති කසල බඳුන් තැබීමට තැනක් යොජනා කළද මේ වන විටත් එම බඳුන් එම ස්ථානයේම තිබෙන බවත් තමා කරන යෝජනා ක්‍රියාත්මක නොකරන බවද පවසන ලදී. 1.0 පොදු පරිපාලන යටතේ 105-8 වැය ශීර්ෂය මගින් කැබ් රථ සඳහා රක්ෂණ ගාස්තු 2026 වර්ෂය සඳහා රු.350,000.00වෙන් කර ඇති බවත් එම මුදල පෙර වර්ෂ වලට සාපේක්ෂව වැඩි බවත් පෙන්වා දුන් අතර අතිගරු ජනාධිපතිතුමා විසින් කැබ් රථ ලබා දෙන බව දන්වා ඇති බැවින් මධ්‍යම රජය දැනුවත් කර එම කැබ් රථයෙහි වටිනාකම ලබා ගෙන ඌරාවුල ,වහව,බුළුපිටිය හරහා මකර දක්වා මාර්ගය ඉදිකිරීමටත් එමගින් සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කර ගැනීමටත් කරගහවෙල පිටමාරුව මාර්ගය ඉදිකර එම ප්‍රදේශවල ජනතාවට හා පාසල් ළමුන්ට ගමනා ගමන පහසුකම් ඇති කිරීමට සුදුසු බව පැවසීය. 2026 වර්ෂයේ අයවැය සඳහා සුභ පතමින් සහයෝගය ලබා දීමට කැමති බවත් පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා අදහස් දැක්වීම.</u>

1.0 පොදු පරිපාලන වියදම් ඇස්තමේන්තුවෙහි 101-4 වැය ශීර්ෂය යටතේ වෙනත් දීමනා (කමිටු දීමනා ,සභා ලේකම් දුරකතන දීමනා ) 2025.08.31 දිනට ගෙවීම් රු.152,500.00 ක මුදලක් වැයවී ඇති බව දක්වා ඇත. කමිටුව සඳහා සහභාගි වන මන්ත්‍රී මණ්ඩලය සඳහා කමිටු දීමනා නොගෙවන බවත් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු මූලාසනයෙන් ඉල්ලා සිටන ලදී.

මෙම කමිටු දීමනා ලබා දෙනු ලබන්නේ සැලසුම් කමිටුව, පරිසර කමිටුව, සභාව පිහිටුවීමට පෙර පැවති කළමණාකරන කමිටුව සඳහා සහභාගිවූ නිළධාරීන් හට කමිටු දීමනා ගෙවූ බව **ගරු මූලාසනය** විසින් පෙන්වා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය අදහස් දැක්වීම.</u>

2026 වර්ෂයේ කෙටුම්පත් අයවැයයෙහි 1.0 පොදු පරිපාලන 1-43 අය ශීර්ෂය යටතේ 2026 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.1,800,000.00 ක් බවත් එම ආදායමෙන් සභාව සතු සුසාන භූමිවල මෘත දේහ තැම්පත් කිරීම රු.360,000.00ක මුදල අඩු කළ විට රු.1,440,000 .00 ක මුදලක් ඉතිරි වේ. ආදාහන කටයුතු සඳහා විදුලිය,ගෑස් නඩත්තු සඳහා යන වියදම අඩු වූ විට අපේක්ෂා කරනු ලබන ආදායම ලබාගත හැකි දැයි විමසන ලදී. ධම්මික මන්ත්‍රීතුමා විපක්ෂය විවේචනය කරන බව පැවසූ බවත් එය ඇත්තක් බවත් පාර්ලිමේන්තුව, පළාත් සභාව යන ඕනෑම තැනක විපක්ෂය විවේචනය කරනු ලබන බවත් විපක්ෂයක් සිටින්නේ වැරදි පෙන්වා දීමට බව පැවසූ අතර දැනට සිටන පක්ෂ මන්ත්‍රීවරු විපක්ෂ මන්ත්‍රීවරු වූයේ නම් ඒ අයද මෙම අයවැය පිළිබඳ විවේචනය කරන බව පැවසීය.

නිදසුනක් ලෙස දැනට ආණ්ඩු පක්ෂයේ සිටින මන්ත්‍රී මණ්ඩලය විපක්ෂයේ සිටින විට පෝට් සිටිය හදන විට ගල් ලෝඩ් ලක්ෂ 12ක් අවශ්‍ය බව පැවසූ විට සීගිරි ගලත් කඩන්න වන බව පැවසූ බවත් නමුත් දැන් පෝට් සිටියත් සාදා සීගිරියත් තිබෙන බවත් පෙන්වා දී විපක්ෂය සිටින්නේ විවේචනය කිරීමට බව පැවසීය. මෙම අයවැය තුළින් හොඳ ආදායම් තත්වයක් පෙන්නුම් කරනු ඇතැයි බලාපොරොත්තු වුවද 2026 අයවැය මඟින් ආදාහනාගාරය මගින් ලබන ආදායම පමණක් ආදායම් උත්පාදන මාර්ගයක් බවත් එමඟින් වුවද ඒ සඳහා වැය වන වියදම අඩු වූවිට බලාපොරොත්තු වන ආදායම නොලැබෙන බව පැවසූ අතර මෙය ඉලක්කම් වලට පමණක් සීමා වූවක් බවත් බිබිල නගරය හරිත නගරයක් බවට පරිවර්තනය කිරීමට කිසිසේත්ම නොහැකි අයවැයක් බවත් පැවසීය.

**<u>ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

මංගල අයවැය ඉදිරිපත් කිරීම පිළිබඳව සතුටට පත්වන බවත් ගරු එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා පෙන්වා දුන් ආකාරයට ගලි බවුසරය කුලියට දීම මගින් ඇස්තමේන්තුගත ආදායම හා රුධිර සීනි පරීක්ෂාව මඟින් ලැබීමට ඇස්තමේන්තුගත ආදායමෙහි පෙර වර්ෂවලට වඩා විශාල ප්‍රමාණයක් වැඩි බව පෙන්වා දුන්නද පෙර වර්ෂ සමග සසඳන විට ගලි බවුසර් කුලියට දීමෙන් ලැබීමට බලාපොරොත්තු වන ආදායමෙහි වෙනස රු.581,950.00 ක් බවත් සීනි පරීක්ෂාවෙන් ලැබීමට බලාපොරොත්තු වන ආදායමෙහි වෙනස රු.130,540.00 ක් බවත් පෙර වර්ෂවල අයවැය සමඟ සසඳන විට ලොකු වෙනසක් සිදු නොවී ඇති බවත් පැවසූ ගරු උප සභාපතිතුමා 2026 කෙටුම්පත් අයවැය පිළිබඳව ගරු එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමාගේ ප්‍රවේශය එතරම් සාධාරණ ප්‍රවේශයක් නොවන බව පැවසීය.

ගරු ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා විසින් පෙන්වා දුන් කම්ටු දීමනා රු.152,000.00 ක මුදල 2025 අගෝස්තු 31 දින දක්වා කළ වියදමක් බවත් එම නිසා 2024 වර්ෂය සමඟ කෙටුම්පත් අයවැයෙහි 101-4 වෙනත් දීමනා වැය ශීර්ෂය සංසන්දනය කළයුතු බව පැවසීය.

ගරු මන්ත්‍රී වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය විසින් විපක්ෂයේ විවේචනය කිරීම් සම්බන්ධයෙන් දැක්වූ පොට් සිටිය සෑදීම පිළිබඳව මෙම අයවැයට ගැලපීම් කළ නොහැකි බව පවසා සිටි අතර නිවැරදි විවේචන සාධාරණව භාර ගන්නා බවත් ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා තේ පැන් සංග්‍රහ නොමැති වීම ,ජලය ලබා දෙන ආකාරය, ලිපි ද්‍රව්‍ය ලබා නොදීම ආදිය තුළින් ගරුත්වයට හානියක් සිදුවන බව පැවසුවද එමඟින් එසේ ගරුත්වයට හානි සිදුවන්නේ නැති බවත් ජනතා පරමාධිපත්‍ය බලයෙන් පත්වී සිටින ජනතා නියෝජිතයන් බවට පත්වීමම ගරුත්වයක් බව පැවසීය. එම ගරුත්වය ලබා ගැනීම සඳහා ලොකු ප්‍රයත්නයක් දැරිය යුතුය. ආහාර වේලක් තේ පැන් සංග්‍රහයක් , ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම තුළින් ගරුත්වයක් ඇති නොවන බවත් ඊට වඩා ලොකු සමාජ පරිවර්තනයක් ඇති කිරීමේ වැඩ පිළිවෙලක අවශ්‍යතාවයක් තිබෙන බව පැවසීය. විපක්ෂ මන්ත්‍රී මණ්ඩලයට මෙම පහසුකම් අවශ්‍ය නම් ලබාදීමට කටයුතු කළහැකි බවත් ජනතාවට නොලැබෙන දෙයක් අප ලබා ගැනීමට නුසුදුසු බැවින් මෙම වියදම් අඩු කර ඇති බවත් අප පක්ෂයේ සියළු දෙනා මන්ත්‍රී දීමනාව ලබා ගෙන පොදු අරමුදලකට ලබා දෙන බවත් එම මුදලත් සාමාජීය සංවර්ධන දේශපාලන පරිවර්තනය සඳහා යොදවන බවත් පැවසීය.

ලිපි ද්‍රව්‍ය ලබා නොදීම සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී ගරු එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් 2022 වර්ෂයේ ලබාදුන් ලියුම් කවර තිබෙන බව පැවසූ බවත් තවත් ලිපි ද්‍රව්‍ය ලබා දුන්නද එම ලිපි ද්‍රව්‍ය

නිවෙස් වල ගොඩගැසෙන බවත් පැවසූ අතර එම තිබෙන ලිපි ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගන්නා ලෙස ද පැවසීය. මෙම අයවැය ලේඛනය පොතක් ලෙස සාදා පිළිවෙලට ලබා නුදුන් බව පැවසුවද මෙය කෙටුම්පත් අයවැයක් බැවින් මෙලෙස ඇමුණුමක් ලෙස ලබාදුන් බවත් මෙම අයවැය ලේඛනයෙහි මුද්‍රණ දෝෂ තිබෙන බව පිළි ගන්නා බවත් පරිපාලනය මැදිහත් වී එය නිවැරදි කර ගත යුතු බවත් පැවසීය.

ගරු එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ප්‍රමිතියෙන් තොරව සංවර්ධන කටයුතු සිදුකර ඇති බව පැවසූ බවත් ප්‍රමිතියෙන් තොර සිදුකර ඇති ඉදිකිරීම් පිළිබඳ ලිඛිතව ලබා දෙන ලෙසත් සමිති සඳහා කොන්ත්‍රාත් ලබා දුන්නද සමිති මඟින් ලබා දෙන කොන්ත්‍රාත් කරුවන් ද දන්නා හඳුනන සාධාරණ පුද්ගලයින් බවත් එම ඉදිකිරීම් පිළිබඳව සොයා බලන බවත් ඒ සඳහා භාවිතා කරනු ලබන ද්‍රව්‍ය වල ප්‍රමිතිය පිළිබඳව සොයා බලන බවත් ඉදිකිරීම් පිළිබඳව පසු විපරම් කරන බවත් පැවසීය. 100% ක් ප්‍රමිතිය පිළිබඳව වගකියන බවත් ප්‍රමිතිගත ද්‍රව්‍ය වලින් ඉදිකිරීම් කිරීම තම පක්ෂයේ ප්‍රතිපත්තිය බවත් පැවසීය. එසේ ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම් සිදුවේ නම් ඒ පිළිබඳව සොයා බලා කාර්මික නිළධාරීන්ට විරුද්ධව කටයුතු කළයුතු බවත් එසේ ක්‍රියා නොකරන්නේ නම් මන්ත්‍රී මණ්ඩලයද වැරදි බවත් දැන දැන කටයුතු නොකරන්නේ නම් එය ඉතා බරපතල වරදක් බව පැවසීය.

ජාතික ජන බලවේග මන්ත්‍රීවරුන් සංවර්ධන කටයුතු කිරීමේදී ස්වේඡාවෙන් සොයා බලා කටයුතු කරන බැවින් ජනතාව වෙනුවෙන් වැය කිරීමට ඇති මුදල් සංග්‍රහ වියදම්, ලිපි ද්‍රව්‍ය සඳහා වියදම් නොකිරීමට තීරණය කර ඇති බවත් පැවසූ අතර අලුත් සංවර්ධන සැලසුම් අයවැයට ඇතුළත් වී නොමැති බව පැවසුවද වියදම් පියවා ගැනීමට වත් මුදල් නොමැතිව භාරගත් මෙම පළාත් පාලන ආයතනයේ වියදම් පියවා ගැනීමට තැම්පත් කර තිබූ ස්ථාවර ගිණුමෙහි මුදල් ගැනීමටද සිදුවූ බවත් එබැවින් මෙම ලැබෙන ආදායමෙන් වියදම් පියවා ගැනීමට පුරෝකතනය කර අයවැය සකස් කර ඉදිරිපත් කළ බවයි.

මෙම ප්‍රදේශයේ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති සිදුකිරීම සඳහා මධ්‍යම රජය අමාත්‍ය මණ්ඩලය සමඟ සාකච්ඡා කරන බවත් මෙම 2026 අයවැය මඟින් ජනතාවට ලස්සන ජීවිතයක් ගත කිරීමට ප්‍රවේශයක් ලබා දිය හැකිවන ප්‍රසස්ත අයවැයක් බව පවසමින් සඳහස් දැක්වම අවසන් කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා අදහස් දැක්වීම.</u>**

2026 කෙටුම්පත් අයවැය ප්‍රකාශයෙහි ඇස්තමේන්තුවට අනුව වැඩිම ආදායමක් උත්පාදනය කරනු ලබන්නේ ආදාහනාගාරය මඟින් බවත් මෙම ආදාහනාගාරය ඉදිකිරීම රන්ජන් සිල්වා සභාපතිතුමාගේ සමයෙහි ආරම්භ කළ එකක් බවත් ජාතික ජන බලවේග පාලන සමයෙහි එය විවෘත කළ බවත් එම කාලයේදී මෙය ඉදි නොකළේ නම් එම ආදායම වත් නොලැබෙන බවයි. ගරු ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් බංකොලොත් වූ රජයක් භාරගත් බව පැවසුවද 2019 වර්ෂයේ ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සමයෙහි රට බංකොලොත් වුවද 2024 වර්ෂයේදී ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා බංකොලොත්භාවයෙන් මිදවූ රටක්, මෙම ආණ්ඩුව භාරගත් බවත් එම රට සංවර්ධනය කර ගෙන යාමට භාරදී ඇති බවත්ය. ගරු ගොඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට විරුද්ධවූ ජනතාව මෙම ආණ්ඩුව පත් කර ගැනීම සඳහා ඡන්දය ලබාදී ඇති බවත් පාවෙන ඡන්ද පවතින බැවින් ගොඩාක් පරිස්සමින් ආණ්ඩුව කරගෙන යායුතු බවත් තම පක්ෂය ස්ථාවරව තමාගේ පක්ෂ රැකගෙන පැමිණෙන බවත් පැවසීය. 1.0 පොදු පරිපාලන යටතේ 1-62 (iv) අබලි ද්‍රව්‍ය විකිණීම 2026 වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.250,000.00 කි. එම මුදල උපයා ගැනීමට හැකිද?

එසේම 2-37(i) විශේෂ බලපත්‍ර ගාස්තු (ජංගම වෙළඳාම් ) යටතේ 1,596,000.00ක මුදලක් ඇස්තමේන්තු කළද පෙර වර්ෂවලට සාපේක්ෂව මෙම මුදල උත්පාදනය කිරීමේ හැකියාවක් තිබේදැයි ප්‍රශ්න කරන ලදී. 2 -62 (iii) අයශීර්ෂය යටතේ 2026 වර්ෂය 250,000.00 ක මුදලක් බලාපොරොත්තු වුවද පෙර වර්ෂවල රු.100,000.00 ක් වැනි අඩු මුදලක් උත්පාදනය වී ඇති බැවින් එම මුදල ඉපයීම කළ නොහැකි බවත් පැවසීය.

ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් අවුරුදු 04කදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්ති ප්‍රකාශයක් බැවින් එහි ඇතුළත් යෝජනා ඉදිරි අයවැය වලදී ඉදිරිපත් කරන බව පැවසුවද 2026 වසරෙහි එක් යෝජනාවක් හෝ ඇතුළත් වී තිබුණේ නම් සෑහීමකට පත් වියහැකි බව පැවසීය.

පිටකුඹුර සතිපොළෙහි කඩ වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය මඟින් ඉදිකර දී ඇති බවත් එහි වැසිකිළි දෙක පෙර පැවති ආණ්ඩුවකින් ඉදිකර දී ඇති බවත් මේ වන විට එම වැසිකිළි දෙක පෞද්ගලීකරණය වී ඇති බවත් එබැවින් ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටි අතර ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි පිටකුඹුර සතිපොළ භූමිය සංවර්ධනය කිරීම ඇතුළත් කර තිබුණද ඒ පිළිබඳව මේ වන විට කිසිම කටයුත්තක් සිදු කර නොමැති බවත් පැවසීය.

2-43 (i) ගලි බවුසරයක් කුලියට දීමෙන් ලැබෙන ඇස්තමේන්තුගත ආදායම හා පෙර වර්ෂවල ආදායම සමඟ සසඳන විට රු.581,950.00 ක මුදලක් බව ගරු උප සභාපතිතුමා පැවසුවද රු.ලක්ෂ 5ක් යනු පොඩි ප්‍රමාණයක මුදලක් නොවන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා බිබිල ප්‍රාදේශීය සභාව මඟින් ලබා දෙන දීමනාව මසකට රු.165,000.00 ක මුදලක් හා වාර්ෂිකව රු.1,980,000.00ක මුදලක් ලබා දෙන බවත් එම මුදල් පෞද්ගලිකව පොදු අරමුදලකට යොදවන බවත් පැවසුවද එම මුදල බිබිල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදවන්නේ දැයි ප්‍රශ්න කළ අතර මෙම දීමනාව සඳහා ලබා දෙන මුදල් බිබිලේ ජනතාවගෙන් අය කර ගත් මුදල් බැවින් බිබිල ප්‍රදේශය සංවර්ධනය කිරීමට යොදවන්නේ නම් සාධාරණ බව පැවසීය. මෙම 2026 අයවැය ඉලක්කමෙන් ලොකු ගණන් වුවද අස්ථාවර අයවැයක් ලෙස පැවසීය.

**පෙ.ව.11.50ට ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය සභා ගර්භයෙන් පිටව ගියාය.**

පිටකුඹුර කොට්ඨාසයේ මන්ත්‍රීවරයෙක් වුවද තමා අඹගොම්මන බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව යෝජනා ඉදිරිපත් නොකිරීමට හේතුව එම බොක්කුවෙන් එගොඩ වන විටම තමාගේ මල්ලීගේ නිවස තිබෙන බවත් එබැවින් පෞද්ගලිකත්වය මුල් කරගෙන මෙම මාර්ගය ඉදිකරන බවට ජනතාව අතර වැරදි මතයක් ගොඩ නැගෙතැයි විශ්වාස කළ බැවින් බවත් මෙම පාලම පහළ පවතින අමුණ කැඩීයාම නිසා මෙම බෝක්කුවෙහි එක් පැත්තක බැම්ම පහත්වී ඇති බවත් මෙම බෝක්කුව 2010,2012 වර්ෂ වලදී රු .1,000,000.00 මුදලකින් ඉදිකර ඇති බවත් දැනටත් රු.1,000,000.00ක පමණ මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කළහැකි බවත් මෙම බෝක්කුව සම්පූර්ණයෙන්ම විනාශ වී ගිය පසු මෙම බෝක්කුව අලුතින් ඉදිකිරීමට ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට කෝටි ගණනක මුදලක් වැය වන බව පැවසූ අතර මෙම බෝක්කුව ඉදි කිරීමට වඩාත් සුදුසු බව පැවසීය.

දැනට දියකොලයාය මාර්ගයෙහි බස් රථයක් ගමන් කළහැකි බව ගරු ගාමිණී මන්ත්‍රීතුමා පැවසුවද බස් රථයක් යෑමට නොහැකි බවත් මාර්ගයට අතු පහත් වී ඇති බැවින් ඒවා ඉවත් කළහොත් වැසි කාලයට නොව නියඟ කාලයට බසයක් යා හැකි බවත් පැවසීය.

2022 වර්ෂයේ ලබාදුන් ලිපි කවර 1000ක් තිබෙන බව පැවසුවේ 2023 වර්ෂයේදී මන්ත්‍රී ධූරය අහෝසි වූ බැවින් එම ලිපි කවර වෙනත් රාජකාරියකට නොයෙදූ බැවින් ඉතිරිව තිබෙන බව යැයි ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් පවසන ලදී.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වීම.</u>

තමා පොදුවේ විපක්ෂ මන්ත්‍රීවරයෙකු බවත් විපක්ෂයේ සියළු දෙනා නිවැරදි දේට අත් දෙකම ඔසවා සහයෝගය ලබා දෙන බව මංගල සභා වාරයේදීම ප්‍රකාශ කළ බවත් මෙහි බහුතරයක් මන්ත්‍රීවරුන් සමාජයේ සුභ සාධන සංගම්වල, සමාජ සේවාවන්වල නියුක්තව සිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ලෙස පත්ව ඇති බවත් දේශපාලන ප්‍රවාහය තුළින් සමාජයට සේවයක් කිරීම සඳහා පත්ව පැමිණ සිටින බව පැවසීය. ගරු උප සභාපතිතුමා විසින් සියළුම මන්ත්‍රීවරුන්ට යෝජනා ලබාදෙන ලෙසත් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් පැවසුවද තමා විසින් යෝජනා දෙකක් ඉදිරිපත් කළද ඒවා

ක්‍රියාත්මක නොකල බව පැවසීය. දියකොලයාය සඳහා බස්රථයක් යෙදවීමට ඉල්ලීමක් කලද ගරු ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් පවසා සිටියේ මෙම මාර්ගයේ යතුරුපැදියක්වත් ගමන් කළ නොහැකි බැවින් බස්රථයක් එම මාර්ගයේ ගමන් කළ නොහැකි බවයි. එපමණක් නොව ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකු සිටියදී විපක්ෂයේ ගාමිණී මන්ත්‍රී වරයාට වැඩක් කළ නොහැකි බව ප්‍රදේශය තුළ මතයක් ගොඩනගා ඇති බවයි. තමා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට හා ඩිපෝ අධිකාරීතුමාට ද මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බව පැවසීය.

අඹගොම්මන පාලම ඉදිකිරීම සඳහා යෝජනා කළද එම අවස්ථාවේදී ප්‍රදේශයේ මන්ත්‍රීවරයා කියා සිටියේ මෙම බෝක්කුව ඉදිකිරීමට තරම් මුදලක් බිබිල ප්‍රාදේශීය සභාවට වැය කළ නොහැකි බවයි. නමුත් මේ සඳහා රු.1,000,000.00 පමණ මුදලක් වැය කර ප්‍රතිසංස්කරණය කළහැකි බවත් මෙවර වර්ෂාවෙන් පාලම කැඩීගිය පසු පවුල් 5ක් පමණ අනාථ වන බවත් ඉන්පසු විශාල මුදලක් වැයකිරීමට සිදුවන බවත් එක් මන්ත්‍රීවරයෙකුගේ ප්‍රකාශයක් නිසා මේ පිළිබඳව කිසිම පසු විපරමක් නොකර එම යෝජනාව මගහැරී බැවින් විපක්ෂයේ මන්ත්‍රීවරයකු ලෙස තමන් මෙම ප්‍රාදේශීය සභාව සඳහා නැවත යෝජනා ඉදිරිපත් නොකරන බවයි. මේ වන විට මෙම ප්‍රාදේශිය සභාව පිළිබඳ විශ්වාසය බිඳී ඇති බවත් විපක්ෂ මන්ත්‍රීවරු යෝජනා ඉදිරිපත් කිරීමෙන් ජනතාවගේ අවශ්‍යතා ඉටුවීම තවත් පිටුපසට යන අතර විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට යෝජනා ඉදිරිපත් කරන ලෙස පැවසුවද ක්‍රියාත්මක වන්නේ සාමූහිකත්වයකින් නොව පෞද්ගලික කුහකකම ඉස්මතුකරමින් බව පවසමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා අදහස් දැක්වීම.</u>

අඹගොම්මන බෝක්කුව ඉදිකිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන අරමුදලෙන් සිදු කිරිමට යෝජනාව ඉදිරිපත් කර ඇති බවත් මේ වනවිට එය අනුමත වී ඇති බවත් ගරු මන්ත්‍රී සඳරුවන් මන්ත්‍රීතුමා සමඟ තමා මේ පිළිබඳව සාකච්ඡා කර ඇතත් ගරු ගාමිණී මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා නොකළ බව පැවසීය. දියකොලයාය මාර්ගයෙහි බසයක් ගමන් කළ නොහැකි පරිදි අබලන් වී ඇති බැවින් බසයක් දැමිය නොහැකි බවත් මුලින්ම මාර්ගය ඉදිකර ගැනීමට කටයුතු කළයුතු බවත් පැවසීය.අඩුම මෙම මාර්ගය මෝටර් ග්‍රේඩර් කරගෙන හෝ සංවර්ධනය කර ගතයුතු බව පැවසීය. මෙම මාර්ගය ඉදිකිරීම සඳහා තමන් කටයුතු කරමින් සිටින බවත් ගරු ගාමිණී මන්ත්‍රීතුමා වැරදි අවබෝධයක සිටින බවත් පැවසීය. එම මාර්ගයේ තමන් ගමන් කරන බවත් බසයක් මාර්ගයේ ගමන් කරන්නේ නම් තමාද කැමති බවත් පැවසූ අතර තමාගේ ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් පොදුවේ කළහැකි දෙයක් තිබේ නම් ඒ සඳහා කටයුතු කරන බවත් පෞද්ගලික වාසියට වැඩ නොකරන බවත් පැවසීය. තමන් ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස විපක්ෂයේ ගරු මන්ත්‍රී සඳරුවන් මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කර කටයුතු කරන බවත් කොට්ඨාසයේ දියුණුව වෙනුවෙන් කටයුතු කරන බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී එල්.ඒ.බී.චින්තිකා හර්ශනී මැතිතුමිය අදහස් දැක්වීම.</u>

තමාගේ නිවස ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳව ස්තූතිය පුදකළ මන්ත්‍රීතුමිය ඉදිරියේදී අම්බලම හන්දිය දක්වා ගමන් කරන මාර්ගය ප්‍රතිසංස්කරණය කරදෙන ලෙසත්, ගලහ ළිඳ හා රතුපස්කැටියඇළ ප්‍රතිසංස්කරණය ලෙසත් ඉල්ලීමක් කළ අතර ප්‍රදේශයේ නළ ළිඳ බාංචත්ත මාර්ගයෙන් ගලා එන ජලය නිසා ගිලා බැසීමට ලක්වන බැවින් එයද සකස් කර දෙන ලෙසත් ඉල්ලා සිටි අතර මෙම 2026 අයවැය මඟින් ඇස්තමේන්තු කළ ආදායම මඟින් වියදම් පියවා ගතහැකි දැයි ප්‍රශ්න කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා අදහස් දැක්වීම</u>

2026 අය වැය සම්බන්ධයෙන් අදහස් දැක්වීමේ දී තමා සතුටුවන බවත් ,එයට හේතුව පෙර ප්‍රාදේශීය සභා කාලවල දී හොරකම් වංචා කළ බව පැවසුව ද ඒ සමයන්හි ඉදිකළ සතොස, රදළියද්ද ආදායනාගාරය ,පුස්තකාල ගොඩනැගිල්ල හා තවත් ඉදිකළ ඉදිකිරීම්වලින් ආදායම් උත්පාදනය කරන බවත් හෘද සාක්ෂියට එකඟව එය පිළිගැනීමට සිදුවන බවත් පැවසී ය. මෙම අයවැය ඉලක්කම්වලින්

පිරුණ අය වැයක් බවත් පසුගිය අයවැයවල කලාත්මක ගතියක් තිබුණු බවත් පසුගිය අයවැයවල ඇතුළත් ආදායම් උත්පාදන මාර්ග පමණක් මෙම අයවැය සඳහා ඇතුළත්ව ඇති බවත් නව ආදායම් උත්පාදන මාර්ග කිසිවක් ඇතුළත් වී නොමැති බවත් අඩුම තරමින් වරිපනම් ප්‍රදේශවත් පුළුල් කිරීමක්වත් ඇතුළත් වී නොමැති බවත් පැවසීය. කණුල්වෙල එළගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යාමට කඩ කාමරයක් කුලියට දීමට කැමැති බව ප්‍රකාශ කර ඔක්තොම්බර් මස 31 වන දින සභාවට භාර දුන් බව තමා හට පුද්ගලයෙකු දැනුම්දුන් බවත් එම ලිපිය පෙත්සම් හා පැමිණිලිවල දී ඉදිරිපත් වෙතැයි බැලුව ද එසේ නොවීම නිසා මෙම ව්‍යාපාරය පෞද්ගලික ව වෙන අයෙකුට දීමට කැමැත්තක් ඇති බව තමා හට හැගෙන බව පැවසීය.

ගරු සභාපතිතුමා විසින් රදලියද්ද ආදාහනාගාරය පෙර පැවති සභාවන් යටතේ සැදුවානම් ආදායම් උත්පාදනය කලේ නැත්තේ ඇයි ද යන්න අසන ලදි. එයට හේතුව වූයේ ඒ සමයෙහි ආදාහනාගාරය ඉදිකරමින් පැවති නිසා බවත් නමුත් දින තුනකට ඉහත දී තමා ආදාහන කටයුත්තකට ආදාහනාගාරය වෙන් කිරීමේ දී වේලාව ප.ව. 2.00 ලබා දුන් අතර ඉන් පසු රෑ වන විට විදුලිය ප්‍රමාණවත් ව නොලැබෙන බැවින් මෘත දේහ ආදාහනය කිරීමට අපහසු බව පැවසූ බැවින් තමා විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කර විදුලිය ලබාගත් බවත් එමගින් පෙනී යන්නේ පවත්නා ප්‍රාදේශිය සභාවේ නොහැකියාව බව යි. නමුත් සභාපතිතුමාට ප්‍රමාණවත් පරිදි විදුලිය ලබා ගැනීමට නොහැකිනම් තමාට ආදාහනාගාරයට ආදාහන කටයුතු සඳහා ප්‍රමාණවත් ව විදුලිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු කිරිමට කටයුතු කළ හැකි බව පැවසීය.

පෙර පැවති ආණ්ඩුවල මැති ඇමතිවරු හොරු වංචාකාරයින් ලෙස පෙන්වා දුන්නද වර්තමානය වනවිට ජාතික ජනබලවේග සාමාජිකයින්ගේ වංචා වැඩ හෙළි වී ඇති බව පවසන ලදී. මීට පෙර පැවති ආණ්ඩු සමයන්වල අයවැය සඳහා ජාතික ජන බලවේග මන්ත්‍රීවරු කොතරම් හොඳ අයවැයක් ඉදිරිපත් කළද පක්ෂයේ ප්‍රතිපත්ති වලට අනුව යැයි පවසා විරුද්ධ වන බවත් එබැවින් විපක්ෂයේ මන්ත්‍රීවරු විරුද්ධවීම සාමාන්‍ය දෙයක් බව පැවසීය. නමුත් වර්තමාන විපක්ෂ මන්ත්‍රීවරු නිවැරදි තීරණ සඳහා අත් ඔසවා සහයෝගය ලබා දෙන බවත් වැරදි තීරණ සඳහා විරුද්ධ වන බවත් පැවසීය.

තමාගේ කොට්ඨාසය වන බුළුපිටිය වසමෙහි හමනව මාර්ගය කොටසක් පමණක් මොටර් ග්‍රේඩර් කර තිබුණු බවත් ඉතිරි කොටස තමාට ඡන්දය ලබාදුන් අය සිටින බැවින් නොකපා ඇති බවත් ප්‍රදේශවාසියෙකු පැවසූ බවත් ඉන් පෙනී යන්නේ පක්ෂග්‍රාහී ලෙස ක්‍රියාකර ඇති බවයි. එබැවින් සියළු ජනතාවට එකසේ සලකන ලෙසත් එවැනි ක්‍රියා නොකරන ලෙස ඉල්ලා සිටි අතර ජාතික ජනබල වේගය සඳහා පොදුජන එක්සත් පෙරමුණ ,එක්සත් ජාතික පක්ෂය ,සමගිජන බලවේග පාක්ෂිකයින් ඡන්දය දී ඇති බවත් එබැවින් ඒවා ආරක්ෂා කර ගැනීමට සුදුසු ආකාරයට කටයුතු කරන ලෙසත් පැවසූ අතර මෙම අයවැයට අනුව කටයුතු කිරීමට සුභ පතමින් අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා අදහස් දැක්වීම.</u>**

විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටම අදහස් දැක්වීමට අවස්ථාව ලබාදුන් බවත් ඒ අනුව ගරු ආර්.බී අත්තනායක මැතිතුමා පැවසූ ආකාරයට කිසිදු විටෙක දේශපාලනය පදනම් කරගෙන මාර්ග මෝටර් ග්‍රේඩර් නොකල බවත් කිසියම් හේතුවක් නිසා මොටර් ග්‍රේඩර් යන්ත්‍රය ක්‍රියා විරහිතවීම, මාර්ග කපන විට විරුද්ධවීම් වැනි ප්‍රශ්නයක් නිසා නතර කරන්නට ඇතැයි සිතන බවත් එවැනි සුළු සුළු දේවල් වලට පවා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විවේචන සිදුවන බවත් පැවසීය.

භාරදුන් ප්‍රාදේශීය සභාව සුවපහසු ප්‍රාදේශීය සභාවක් නොවන බවත් සියළු සේවකයින් වැටුප් ගෙවමින් අතිකාල ලබා දෙමින් අඩුපාඩු නොමැතිව කටයුතු කළහැකි ප්‍රාදේශිය සභාවක් භාර නොදුන් බවත් භාර දෙන විට ආදායමට වඩා වියදම වැඩිවූ ප්‍රාදේශීය සභාවක් භාරදුන් බව පෙන්වා දෙන ලදී.

මෙම 2026 අයවැය ලැබුණු ආදායම් සමාලෝචනය කරමින් නිළධාරීන් සමඟ එක්ව සකස් කළ බවත් පෙන්වා දෙන ලදී. මහ ජනතාවට ලොකු සුභසාධනයක් ලබා දෙමින් විශාල සංවර්ධනයක් සිදුකළ හැකි අයවැයක් ඉදිරිපත් කිරීමට කැමති වුවත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළහැකි අයවැයක් ඉදිරිපත් ඇති

බවත් පැවසූ ගරු මූලාසනය විසින් පැවති ආණ්ඩු පාලන වල ආණ්ඩු පෙරලිය සිදුවූ විට රාජ්‍ය ආයතනවල නිළධාරීන් සඳහා ස්ථානමාරුවීම් ,සේවයෙන් පහකිරීම් ආදිය සිදු කරමින් දේශපාලන පලිගැනීම් සිදුකලද මෙම ආණ්ඩුව පත්වූ විට එවැනි ක්‍රියාවන් කිසිවක් සිදු නොවූ බව පෙන්වා දෙන ලදී.

ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා , ගෝඨාභය ජනාධිපතිතුමාගෙන් පසුව ජනාධිපති වී බංකොලොත්වූ ආණ්ඩුව නැවත යථා තත්වයට පත්කල බව පැවසුවද එය එසේ නොවන බවත් එතුමාගේ පෙර පාලන සමයන්වල රට පාලනය කළ ආකාරය එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් සමඟ සිදු කළ කටයුතු මිනිසුන්ට කළ හිරිහැර තාඩන පීඩන ආදිය සිදුකළ ජනාධිපතිවරයෙක් බව පෙන්වා දෙන ලදී. 1988 – 1989 සමයන්හි පාර්ශව දෙකක අතර සිදුවූ අරගලය හැරුණු කොට මෙම ආණ්ඩුවෙන් කිසිදු අකටයුත්තක් සිදු නොවූ බවත් පෙර පැවති ආණ්ඩු වලින් මැතිවරණයෙන් පසු සිදුවූ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව මෙම සියළු මනිත්‍රීවරුන් දන්නවා ඇතැයි පවසා සිටින ලදී.

2026 අයවැය සම්බන්ධයෙන් අදහස් දැක්වීම පිළිබඳ ස්තූතිය පුදකළ අතර කිසිම මන්ත්‍රීවරයෙක් විසින් සංශෝධන ඉදිරිපත් කර නොතිබීම නිසා නීත්‍යානුකූලව අයවැය සංශෝධනය කළ නොහැකි බව පැවසීය.

ගරු පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින් ජනාධිපතිතුමා විසින් ලබා දීමට අපේක්ෂිත කැබ් රථයේ වටිනාකම මුදලින් ලබාගෙන ඌරාවුල මකර මාර්ගය සංවර්ධනය කිරීමට කළ යෝජනාව මෙන් එකළ විපක්ෂ මන්ත්‍රීවරයෙකු වූ තමාද සිදුකළ බව පැවසීය. බිබිල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කඩා අලුතින් ඉදි කරන විට එම මුදල වෙනත් සංවර්ධන යෝජනා වලට යෙදවීමට යෝජනා කළද එම යෝජනා එකළ ප්‍රතික්ෂේප වූ බවත් ඒ වන විට තිබුණු ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල රු.1,800,000.00 වැය කර ප්‍රතිසංස්කරණය කර තිබූ බවත් පැවසීය. එසේම බස් නැවතුම්පොළ රු.1,400,000.00 ක් වැය කර වැසිකිලියක් ඉදි කිරීමේදී, මෙම වැසිකිලිය බස් නැවතුම්පොල සංවර්ධනය කිරීමේදී කඩා ඉවත් කිරීමට සිදුවන බැවින් ඉදිරියට ගැලපෙන ආකාරයට ඉදිකරන ලෙස යෝජනා කළද එය එසේ සිදු නොකර පසු කාලීනව කඩා ඉවත් කිරීමට සිදුවූ බවත් පැවසීය. එවන් ප්‍රචණ්ඩ යුගයකින් පසුව 3% ක තිබූ ඡන්ද ප්‍රතිශතයකින් 51%ක් දක්වා වැඩි කරගෙන ඉදිරියට පැමිණි බව පවසා සිටින ලදී.

ගරු අත්තනායක මැතිතුමා විවේචන ඉදිරිපත් කලද එසේ ඉදිරිපත් කිරීමට මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙන බවත් වර්තමාන ආණ්ඩුව විනාශකාරී ලෙස ජාතික ධනය, ජාතික දේපල භාවිතා නොකරන බවත් වංචා ,දූෂණ ,හොරකම ,නාස්තියෙන් තොරව කටයුතු කර ඇති බවත් පැවසීය. ආණ්ඩු බලය තිබුණද එවැනි ක්‍රියාවන් සිදුකළහොත් රබර් බෝලයක් වතුර යට රඳවා ගෙන තිබුණද එය උඩ එන බවත් එලෙස වංචා, දූෂණ, හොරකම්, මැරකම් නාස්තිය සිදුකළහොත් හමස් පෙට්ටියක හංගා තිබුණද ඒවා ඉදිරියට ගෙන දඬුවම් ලබා දෙන බව පැවසීය. අවුරුදු දහයකට විස්සකට පමණ පැරණි මිනීමැරුම්, මංකොල්ලකෑම්, කුඩු ගෙනඒම්, දූෂණ, හොරකම්, රාජ්‍ය දේපල අවභාවිත කිරීම්, ආදිය පිළිබඳව නූතනයේ නීතිය ක්‍රියාත්මක වන බවත් පැවසීය.

සෑම දිනකම ආණ්ඩු බලය තබා ගැනීමට නොපැමිණි බවත් පෙර තිබූ වැරදි නිවැරදි කරගෙන දේශපාලන නිවැරදි මාවතකට ගමන් කරන්නේ නම් , ජාතික ජනබල වේග ආණ්ඩුව වර්තමානයේ පත් කර ගත්තා සේ අනෙකුත් පක්ෂද ජනතාව විසින් පත් කර ගනු ඇතැයිද එසේ කරන්නේ නම් එයත් හොඳ බව පැවසීය.මේ වනවිට රජය දූෂණය නවතා ඇති බවත් ලංකා ඉතිහාසයේ මෙතෙක් සිදු නොවූ පොලිස්පති, බන්ධනාගාර අධිපති පවා හිරේ ගිය බවත් තරාතිරම් නොබලා කටයුතු කරන බැවින් හොරකමක් කිරීමට පෙර දෙවරක් සිතිය යුතු බවත් පැවසීය. තමාද නොතේරුමෙන් හෝ සානුකම්පිතව ශ්‍රද්ධාවෙන් තීරණ ගැනීමට යාමේදී බිබිල ප්‍රාදේශීය සභාවේදී නිළධාරීන්ද පනත ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය බව පෙන්වා දෙන බවත් එවැනි රාජ්‍ය නිළධාරීන් බිහිවෙමින් පවතින බවත් පැවසීය. අතීතයේ නායකයින් කිසියම් කාර්යයක් පැවරූ විට වැරදි රාජකාරියක් වුවද කිරීමට සිදුවන රාජ්‍ය සේවයක් පැවතුන බව පැවසීය.

වැරදි ,වංචා, දූෂණ ,හොරකම් තිබේ නම් ඒවා පැමිණිලි කරන ලෙසත් එසේ නැතිනම් ලියාපදිංචි තැපැලෙන් ලිඛිතව ඉදිරිපත් කර ලියාපදිංචි කළ රිසිට්පත තබා ගන්නා ලෙසත් කිසියම් දිනෙක එය

ප්‍රයෝජනයට ගත හැකි බවත් පැවසීය. අපේ රට සියළු අංශයන්ගෙන් පරිපූර්ණ රටක් බැවින් අනාගතයේ අපේ දූ දරුවන්ට රැක දීමට කටයුතු කළයුතු බව පැවසීය.

2026 කෙටුම්පත් අයවැය ලේඛනය සඳහා කිසිඳු මන්ත්‍රීවරයෙක් සංශෝධන ඉදිරිපත් කර නොතිබීම නිසා එම අයවැයෙහි සංඛ්‍යා දත්ත එලෙසම පවතින බවත් මෙම අයවැය ඒකමතිකව සම්මත කර ගන්නවාද එසේ නැතිනම් බෙදීමක් අවශ්‍ය නම් ඒ අනුව ක්‍රියා කරන ලෙසත් ගරු මූලාසනය විසින් දන්වා සිටින ලදී.

විවාද අවස්ථාව අවසන් බව දැන්වූ මූලාසනය විසින් අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් 2026 අයවැය සම්මත කිරීම සඳහා ඡන්දයක් පැවැත්වීමට සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2026 වර්ෂයේ අයවැය සම්මත කිරීම සඳහා ඡන්දය පැවැත්වීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම අවස්ථාවේදී සභා ලේකම් විසින් ඡන්දය පවත්වා එහි ප්‍රතිඵලය ගරු මූලාසනය වෙත භාර දෙන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2026 අයවැය සඳහා බෙදීමක් ඉල්ලුම් කළ බැවින් පැවැත්වූ ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි වේ.

| අනු අංකය | මන්ත්‍රීතුමාගේ /තුමියගේ නම | පක්ෂව ඡන්දය ලබා දුන් ගණන | විපක්ෂව ඡන්දය ලබා දුන් ගණන | ඡන්දය දීමෙන් වැලකී සිටි ගණන | ඡන්ද විමසීම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි ගණන | රැස්වීමට සහභාගි වූ ගණන |
|---|---|---|---|---|---|---|
| 01 | වී.සරත් විදානගම මැතිතුමා | √ | | | | √ |
| 02 | එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | √ | | | | √ |
| 03 | ආර්.බී.අත්තනායක මැතිතුමා | | √ | | | √ |
| 04 | ඩබ්.එම්. රූපසේන මැතිතුමා | √ | | | | √ |
| 05 | බී.එම්. වීරසේකර මැතිතුමා | √ | | | | √ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 06 | ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | √ | | | | √ |
| 07 | ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | √ | | | | √ |
| 08 | ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | √ | | | | √ |
| 09 | පී.ජයන්ති මැතිතුමිය | √ | | | | √ |
| 10 | ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | √ | | | | √ |
| 11 | ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා | √ | | | | √ |
| 12 | පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | | | √ | | √ |
| 13 | එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | | √ | | | √ |
| 14 | කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | | √ | | | √ |
| 15 | ඩබ්.එම්.එම්.ඩබ්.පී. සමරකෝන් මැතිතුමිය | | | | √ | √ |
| 16 | එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | | √ | | | √ |
| 17 | ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | | √ | | | √ |
| 18 | ජේ.ඒ.ජී. වි. වර්ණකුලසූරිය මැතිතුමා | | √ | | | √ |
| එකතුව | | 10 | 06 | 01 | 01 | 18 |

ඒ අනුව 2026 අයවැය සඳහා

පක්ෂව ජන්ද - 10
විපක්ෂව ජන්ද - 06
ඡන්දය ලබා දීමෙන් වැලකී සිටි - 01
සභා ගර්භයේ නොසිටි - 01

ඒ අනුව මන්ත්‍රීවරු 17 දෙනෙකු ඡන්දය ප්‍රකාශ කර ඇති අතර වැඩි ඡන්ද 03කින් 2026 අයවැය සභා සම්මත වූ බව ගරු මූලාසනය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

ඒ අනුව 2026 වර්ෂයේ කෙටුම්පත් අයවැය බහුතර ඡනදයෙන් සභා සම්මත විය.

## **05.01.02. කඩ කාමර පැවරීමේදී අය කරනු ලබන පැවරුම් ගාස්තු සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර පැවරීමේදී අය කරනු ලබන පැවරුම් ගාස්තු සම්බන්ධයෙන් 2021.03.23 දින බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තා අංක 05.01.11 සහ 2022.01.20 දින 05.01.14 සභා තීරණ අනුව තීරණය කර ඇත.

ඒ අනුව 2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි IV (අ) වැනි කොටස පළාත් සභා පළාත් පාලන නිවේදන සම්මත අතුරු ව්‍යවස්ථාවේ පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අංක 40 පරිදි දොඩම්ගොල්ල අංක 02 කඩ කාමරය පැවරීම සඳහා 2025.08.19 දින 05.01.18 සභා තීරණයක් ලබා ගෙන ඇත. ඒ අනුව අය කළ යුතු පැවරුම් ගාස්තු තීරණය කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

ගරු මන්ත්‍රී පී.කේ.ඩී.පුෂ්ප කුමාර මැතිතුමා විසින් දොඩම්ගොල්ල කඩකාමරය පැවරීම සඳහා පැවරුම් ගාස්තු වශයෙන් රු.10,000.00 ක මුදලක් අය කිරීමට සුදුසු බව පවසන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව දොඩම්ගොල්ල අංක 02 කඩකාමරය පැවරීම සඳහා පැවරීමේ ගාස්තුව වශයෙන් රු.10,000.00ක මුදලක් අය කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.03. 2025.09.23 දින 05.01.12 සභා තීරණය අනුව බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර වලින් ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශී සභාවේ 2025.09.23 දින 05.01.12 සභා තීරණය අනුව බිබිල පොදු වෙළඳපොල කඩ කාමර වලින් දැනට අය කරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය වන දිනකට 1% ක ප්‍රමාණය 5% ක් දක්වා අඩු කිරීමට තීරණය කර ඇත.

නමුත් 2013.06.28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි 42 (ii) කඩ කාමර ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් පහත පරිදි සඳහන්වේ.

" කවර හෝ බදුකරුවෙකු විසින් 42.1 ඡේදයේ නියම කර ඇති ආකාරයෙන් අත්සන් කළ බදු ගිවිසුමට අනුව එකඟ වූ දින හෝ ඊට පෙර අදාළ මාසික බදු කුලිය ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක නියමිත දිනට ගෙවීමට ඇති සෑම මාසයක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් අදාළ මාසික කුලියෙන් 10%ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීම බදුකරු යටත් විය යුතුවාත් හැර මෙකී නියමයන් අදාළ ගිවිසුමේ ඇතුළත් කර තිබිය යුතුය."

ඒ අනුව 2013 සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමාද ගාස්තුව 10 % ක් ලෙස පිළිගෙන ඇති බැවින් 2025.09.23 දින 05.01.12 සභා තිරණය පරිදි 5% ක ප්‍රමාද ගාස්තුවක් අය කිරීම ගැටළු සහගත බැවින් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව 2025.09.23 දින 05.01.12 සභා තීරණය අනුව බිබිල පොදු වෙළඳපොල කඩ කාමර වලින් දැනට අය කරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය වන දිනකට 1% ක ප්‍රමාණය 5% ක් දක්වා අඩු කිරීමට තීරණය කලද 2013 සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමාද ගාස්තු 10% ලෙස පිළිගෙන ඇති බැවින් 2025.09.23 දින 05.01.12 සභා තිරණය පරිදි 5% ක ප්‍රමාද ගාස්තුවක් අය කිරීම ගැටළු සහගත බැවින් එම පොදු වෙළඳපල කඩ කාමර වලින් මාසිකව 5%ක් ලෙස අය කිරීමට තීරණය කර තිබූ ප්‍රමාද ගාස්තු මාසිකව 10%ක් ලෙස අය කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී පි.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව 2025.09.23 දින 05.01.12 සභා තීරණය අනුව බිබිල පොදු වෙළඳපොල කඩ කාමර වලින් දැනට අය කරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය වන දිනකට 1% ක ප්‍රමාණය මාසිකව 5% ක් දක්වා අඩු කිරීමට තීරණය කලද 2013 සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමාද ගාස්තු මාසිකව 10% ලෙස පිළිගෙන ඇති බැවින් 2025.09.23 දින 05.01.12 සභා තිරණය පරිදි මාසිකව 5% ක ප්‍රමාද ගාස්තුවක් අය කිරීම ගැටළු සහගත බැවින් එම පොදු වෙළඳපල කඩ කාමර වලින් මාසිකව 5%ක් ලෙස අය කිරීමට තීරණය කර තිබූ ප්‍රමාද ගාස්තු නව තක්සේරුවෙන් පසු නව බඳු ගිවිසුමක් අත්සන් කිරීමේදී ප්‍රමාද ගාස්තු 10% අය කිරීමටද තීරණය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.04. 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම.

මූල්‍ය රීති සංග්‍රහයේ 203 වගන්තියට අනුව 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්විය යුතුය. ඒ අනුව 2025 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පි.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව සම්බන්ධයෙන් විවාදය සඳහා අවස්ථාව සලසා දෙන ලදි

විවාදය සඳහා ඉදිරිපත් නොවුයෙන්
විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

මූල්‍ය රීති සංග්‍රහයේ 203 වගන්තියට අනුකූලව 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට ,

01. සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ විමර්ශන නිළධාරි - සභාපති
(බිබිල ප්‍රාදේශීය සභාව අධීක්ෂණය කරනු ලබන විමර්ශන නිළධාරි හැර)
02. බිබිල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ නියෝජිතයකු ලෙස - සාමාජික
ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා
03.රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ නිළධාරියෙකු - සාමාජික
04.බිබිල ප්‍රාදේශීය සභාවේ නිළධාරීන් දෙදෙනෙකු - සාමාජික
- පී.දිනූෂා මනෝරි මිය - සංවර්ධන නිළධාරි
- එස්.එම්.කාංචනා මධුශානී මිය -සංවර්ධන නිළධාරි
05. බිබිල ප්‍රාදේශීය සභාවේ ගබඩා භාර විෂය භාර නිලධාරි - සහායක

යන මහත්ම මහත්මීන් සුදුසු බව ගරු උප සභාපති එච්.එම්.අනුරසිරි ගුණසේකර මැතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එම් වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## <u>05.01.05. වැගම බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රජාශාලාව පිහිටි ඉඩමෙහි වගා කළ තාවකාලික භෝගයෙහි අස්වැන්න නෙලා ගන්නා තෙක් අවසර ඉල්ලීම.</u>

බිබිල වැගම වාසනා උයන පදිංචි ආර්.ඒ.එන් නියතපාල මහතා හට වැගම ප්‍රජා ශාලාව පිහිටි ඉඩමෙහි තාවකාලික භෝග වගා කිරීම අත්හිටුවීමට 2025.09.23 දිනැති මහා සභාවේදී අංක 05.01.11 යෝජනාව මගින් තීරණය කර ඇත. නමුත් එම මහතා 2025.10.22 දින ලිපියක් මගින් තමා 2025.10.17 දින බීජ සිටවූ බැවින් (ඉරිඟු ඇට 250g, බණ්ඩක්කා 50 g, කවුපි 200g ) එම තාවකාලික භෝගයන්හි අස්වැන්න නෙලා ගන්නා තෙක් අවසර ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇති අතර මෙය නොදැනුවත් කමින් සිදුවූවක් බවත් නැවත භෝග වගා නොකරන බවත් ඉදිරියේදී මෙම ස්ථානය පිරිසිදු කර නඩත්තු කර පවත්වා ගෙන යන ලෙසත් ඉල්ලුම් කර ඇත. ආර්.ඒ.එන් නියතපාල මහතාගේ මෙම ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය ,තම වැගම කොට්ඨාසයේ පිහිටා ඇති මෙම බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රජාශාලාව පිහිටා ඇති ඉඩමෙහි ආර්.ඒ.එන් නියතපාල මහතා විසින් නොදැනුවත්භාවය නිසා වගා කටයුතු කර ඇති නිසාත් මින් ඉදිරියට වගා නොකරන බව දන්වා ඇති නිසාත් එම වගාවෙහි එල නෙලා ගන්නා තෙක් අවසර ලබා දීමට කටහුතු කරමු යැයි ද පාට පක්ෂ

වලින් තොරව සාමූහකව යන ගමනක් බැවින් මෙම මහතා හට සත්භාවයෙන් යුතුව වගාවෙහි අස්වනු නෙලා ගැනීමට අවසර ලබා දෙමු යැයි පවසා සිටින ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

මෙම බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වැගම කොට්ඨාසයෙහි පිහිටා ඇති ප්‍රජාශාලාව පිහිටි ඉඩමෙහි ආර්.ඒ.එන්.නියතපාල මහතා මේවන විට මෙම ඉඩමෙහි බීජ සිටුවා ඇති බැවින් එම වගාවෙහි අස්වැන්න නෙලා ගන්නා තෙක් අවසරය ලබා දීමටත් ඒ මහතා දැනට ප්‍රජා ශාලාවෙහි යතුර භාරව කටයුතු කරන බැවින් එම යතුර එතුමන්ගෙන් ලබාගෙන එම ප්‍රජා ශාලාව පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි ග්‍රාම නිළධාරි හා ප්‍රජා කටයුතු කරනු ලබන නිළධාරීන්ගේ රාජකාරි කටයුතු සඳහා ලබාදීමටත් එම ප්‍රජා ශාලාවෙහි යතුර නිළධාරීන්හට සහය දියහැකි වඩාත් කැපවීමක් කළහැකි ක්‍රියාකාරී ස්වෙච්ඡා සංවිධානයකට භාර දිමට සැලැස්වීමට කටයුතු කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකගතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකගතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.06.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

2025.11.06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේදී නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ජල ගබඩාව සඳහා 50 Kg ක්ලෝරීන් බැරල් 20 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම .
2. බිබිල ප්‍රාදේශීය සභාවේ ලිපිද්‍රව්‍ය ගබඩාව සඳහා A4 බන්ඩල් 30 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.
3. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් 252-6355 කැබ් රථය සඳහා ටයර් 04 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.
4. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් PF 7391 කැබ් රථයේ අළුත්වැඩියාවට පෙර පරීක්ෂාවේදී අළුත්වැඩියාව කිරීම සඳහා නිර්දේශ කර ඇති REAR BRAKE LINERS REPLACEMENT සඳහා අවශ්‍ය REAR BRAKE LINER SET 01 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.
5. රදලියද්ද ආදාහනාගාරය සඳහා අවශ්‍ය ගිනි නිවන උපකරණ හා ඇම්ප් සහ බල්ෆ් සෙට් (වයර් සමඟ) ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.
6. බිබිල ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සඳහා 2018.01.24 දිනැති රා.ප.ච.02/2018 අනුව වසරකට අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා කාර්යාලයේ නිලධාරීන් 35 දෙනෙකු සඳහා විෂයභාර නිලධාරීන්ගේ කාර්යභාරය පිළිබඳ එක්දින පුහුණුවක් ලබා දීම හා ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම.

7. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA 5419 මෝටර් ග්‍රේඩරය සඳහා ටයර් 01 ක් ටියුබ් එකක් හා කොලර් 01 ක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.
8. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල රදළියද්ද ආදාහනාගාරයට මෘත දේහ අදාහනය සඳහා අවශ්‍ය ගෑස් ලබාගැනීම සඳහා මීට පෙර ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බැවින් තෝරාගන්නා ලද ඒ.ආර්.අබේසිංහ ඩිස්ට්‍රිබියුටර් ආයතනයෙන් එම මිල ගණන් යටතේ ගෑස් ටැංකි 03 ක් නැවත පිරවීමටත් ඉදිරියේදී ගෑස් මිලදී ගන්නා විටද ලාෆ් සමාගමට අයත් ඒ.ආර්.අබේසිංහ ඩිස්ට්‍රිබියුටර් ආයතනයෙන්ම ගෑස් පිරවීම් කටයුතු සිදුකිරීම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මෙම යෝජනාව පිළිබඳ විවාදයක් සිදු නොවූ අතර විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.07. ආදාහනාගාරයේ ඉදිකිරීම් කරනු ලබන පැති බැම්මේ සැලැස්ම වෙනස් කර ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයේ තාප්පය ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදී සැලසුමට ඇතුළත් කර ඇති ගඩොල් කුළුණු සහිත තාප්පය ශක්තිමත් භාවයෙන් අඩු බවත් ඒ වෙනුවට කොන්ක්‍රීට් කුළුණු යොදා තාප්පය සකස් කළයුතු බව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් පවසන බැවින් ඇස්තමේන්තුවේ සඳහන් ගඩොල් කුළුණු වෙනුවට කොන්ක්‍රීට් කුලුණු යොදා තාප්පය සකස් කිරීමට අදාළව සකස් කළ අමතර වැඩ සඳහා ඇස්තමේන්තුව (රු.1,120,618.26) සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

රදළියද්ද ආදාහනාගාරයේ තාප්පය ඉදි කිරීම සඳහා අරමුදල් ලබා දෙනු ලබන්නේ පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල මගිනි. ඇස්තමේන්තු සකස් කර ඇත්තේ පාදම උඩ බ්ලොක් ගලෙන් කුලුණු ඉදිකර තාප්පය ඉදිකිරීම සඳහා වුවද එය ශක්තිමත් නොවන බැවින් කම්බි යොදා කොන්ක්‍රීට් කණු ඉදිකර බැම්ම බැද උඩින් කොන්ක්‍රීට් බීම් එකක් යොදා ශක්තිමත්ව සකස් කිරීමට හා එම බිත්තියේම භෂ්මාවශේෂ තැම්පත් කළ මල් පොච්චි තැබීමට හැකි වන පරිදි රාක්ක සෑදීම සඳහා පළාත් නිශ්චිත අරමුදලට අමතරව සභා අරමුදලින් රු.1,120,618.26 ක ඇස්තමේන්තුවකට අනුව ඉදිකිරීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් පැහැදිලි කරන ලදී.

පළාත් නිශ්චිත සංවර්ධන අරමුදලට අනුව ඇස්තමේන්තු ලබා ගෙන ඇති කොන්ත්‍රාත්කරුවන් මේ වනවිට ඉදිකිරීම් කටයුතු කරගෙන යන බැවින් ශක්තිමත්ව ඉදිකිරීම් කටයුතු කරගෙන යන බැවින් සහා අරමුදලින් මුදල් වැයකර ශක්තිමත්ව බැම්ම ඉදිකර ගැනීම සඳහා අනුමැතිය ලබාදීමට සුදුසු බවද ගරු මූලාසනය විසින් පවසා සිටින ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් මෙම ඉදිකිරීම පිළිබඳව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත දැනුවත් කර ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හැකිනම් ප්‍රාදේශීය සභා අරමුදලින් මුදල් වැය නොකර තාප්පය ඉදිකිරීමට හැකිවන බව පෙන්වා දෙන ලදී.

මේ වන විට තාප්පය ඉදිකිරීම් කටයුතු සිදුකර ගෙන යන බැවින් පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කළහොත් දිගු කාලයක් ගතවන බැවින් මෙම මුදල් වර්ෂය ඇතුළත මෙම ඉදි කිරීම සිදු කර ගැනීමට නොහැකි වන බැවින් සභා අරමුදලින් ඉදිකිරීමට තීරණය කළ බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී. එසේම දැනට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති කොන්ත්‍රාත්කරුවන්ට එවැනි දීර්ඝ කාලයක් ඉදිකිරීම් නවතා සිටිය නොහැකි බවද පෙන්වා දෙන ලදී.

මෙම ඉදිකිරීම සිදු කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලැබුයේ කවුරුන්දැයි  ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින් ප්‍රශ්න කරන ලදී. බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරි ලෙස සේවය කළ පී.ජී.එන්. පරපිටිය මහතා විසින් ඇස්තමේන්තු සකස් කර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බව ගරු මූලාසනය විසින් පැහැදිලි කරන ලදී.

මෙම ආදාහනාගාරය  බිබිල ප්‍රදේශයට සම්පතක් බැවින් මෙම ඉදිකිරීම අනිවාර්යයෙන්ම ඉදිකළයුතු බැවින් විරෝධතාවය ප්‍රකාශ කරමින් සභා අරමුදලින් මුදල් වැය කිරීමට අනුමැතිය ලබා දීමට කැමැති බව ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. හෂ්මාවශේෂ තැම්පත් කිරීම සඳහා මල් බඳුනක් තැබීමට රාක්ක සෑදීම ඉතා සුදුසු බවද ප්‍රකාශ කරන ලදී. ගරු පී.කේ.ඩී.රෝහිත පුෂ්පකුමාර මැතිතුමා විසින් මෙය අපේ ප්‍රදේශයේ වටිනා ඉදිකිරීමක් බැවින් කාටත් ප්‍රයෝජනවත් වන ස්ථානයක් බැවින් ඒ සඳහා සියළු මන්ත්‍රීවරුන් එක්ව සහයෝගය ලබාදී අනුමත කර ගනිමු යැයිද ඉල්ලා සිටින ලදී. නායකඳුර ජල යෝජනා ක්‍රමයේ ජල පිල්ටරය ඉදිකර ඇති ආකාරය ද කාර්මික නිළධාරීන්ගේ වැරදි නිසා සිදුවූවක් බව පෙන්වා දුන්නේය.

කාර්මික නිළධාරීන්ගේ වැරදි තීරණයක් ලෙස හාමාපොළ මාර්ගයක් ඉදිකිරීම පිළිබඳව ගරු ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා පෙන්වා දුන් අතර ගරු ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා ද දොඩම්ගොල්ලෙහි ප්‍රමිතියෙන් තොරව මාර්ගයක් ඉදිකර ඇති බව පෙන්වා දුන් අතර ආදාහනාගාරයේ තාප්පය ඉදිකිරීමට සැලසුම් සකස් කළ කාර්මික නිළධාරි පිළිබඳව විරෝධය පල කර සිටියේය.
කාර්මික නිළධාරීන්ගේ වැරදි ක්‍රියා කලාපයන් පිළිබඳ දන්වා විරෝධතාවය පලකර ගරුආණ්ඩුකාර තුමාට ලිපියක් ඉදිරිපත් කළයුතු බව ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ආදාහනාගාරයේ තාප්පය ඉදිකිරීම සම්බන්ධයෙන් ඇස්තමේන්තු ඉදිරිපත් කළ කාර්මික නිළධාරි වැරදි නම් එම නිළධාරි හට නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු බවත් සභා අරමුදලින් මුදල් වැය කර ඉදිකිරීමට විරුද්ධ බව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණ කුලසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා  ද ඇස්තමේන්තු කරන අවස්ථාවේ මුදල අනුමත කර නොගෙන පසුව සභා අරමුදලින් වැය කර ඉදි කිරීමට විරුද්ධ බව ප්‍රකාශ කරන ලදී.

යෝජනාව පිළිබඳ විරෝධතාවය පල කරනවා නොව මෙම ක්‍රමය පිළිබඳ විරෝධතාවය ප්‍රකාශ කරන බවත් ජනතා නියෝජිතයින් ලෙස පත් වි කාර්මික නිළධාරීන්ගේ වැරදි තීරණ නිසා සභා අරමුදල් වැය කිරීමේ ක්‍රියාවන් වලට සහයෝගය ලබාදීම නුසුදුසු බවත් එම කාර්මික නිළධාරි හට විරුද්ධව ක්‍රියා මාර්ගයක් ගතයුතු බවද ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය  පැවසීය.

ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමාද පළාත් සභාව මඟින් ලබා දෙනු ලබන ලක්ෂ 22 ක මුදලින් තාප්පය ඉදිකර ඉතිරි කොටස පසුව සභා අරමුදලින් මුදල් යොදවා සිදු කරන්නේ නම් කැමති බවත් එසේ නොකරන්නේ නම් විරුද්ධ බව පැවසීය.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

මෙම යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධ බව ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණ කුලසූරිය මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා , ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා හා ගරු මන්ත්‍රී කේ.ජී.උදය සඳරුවන් ජයසිංහ මැතතුමා විරෝදධතාවය පල කළ අතර ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා හා ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා විවේචනය කරමින් යෝජනාව සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලදී. එම අවස්ථාවේ ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය සභාවේ නොසිටි අතර අනෙකුත් සියළු මන්ත්‍රීවරුන් යෝජනාව සම්බන්ධයෙන් පක්ෂ බව ප්‍රකාශ කරනලදී.

ඒ අනුව අදාළ යෝජනාව මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයකගේ එකඟතාවය මත සභා සම්මත විය.

## 05.01.08. බදුල්ලගම්මන මාර්ගය ඉදිකිරීම සඳහා පළාත් නිශ්චිත අරමුදලට අමතරව වැඩියෙන් වැය වූ මුදල සභා අරමුදලින් පියවීම.

බිබිල බදුල්ලගම්මන මාර්ගය ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේදි වංගු සහිත ස්ථානයක මාර්ගය ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී පළාත් නිශ්චිත අරමුදලෙහි ඇස්තමේන්තුගත මුදලට වඩා මුදලක් වැය විය. මාර්ගයෙහි පළල අඩි 12ක් වන පරිදි කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු.977,147.76ක් වුවද මෙම මාර්ගයෙහි වංගු සහිත ස්ථානය අඩි 14ක් ප්‍රමාණයට කොන්ක්‍රීට් කර ඉදි කිරීම සඳහා කොන්ක්‍රීට් සණ මීටර් 3.5 කට ආසන්න ප්‍රමාණයක් කොන්ත්‍රාත්කරු වූ බිබිල බදුල්ලගම්මන පුබුදු ගොවි සංවිධානයට වැය වී ඇත. එබැවින් වැඩිපුර ඉදිකිරීම සඳහා වැය ඇස්තමේන්තුව වන රු. 111,674.48 ක මුදලක් සභා අරමුදලින් එම සංවිධනයට ගෙවීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු උප සභාපති අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මෙම බදුල්ලගම්මන මාර්ගය මේ වන විට ඉදිකර අවසන් බැවින් මුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබාදිය යුතු වුවද මාර්ගයෙහි වංගුවක් තිබූ පමණින් මාර්ගයෙහි පළල වැඩි කළයුතු නොවන බව ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා පැවසීය.

මෙම මාර්ගයේ වංගු සහිත ස්ථානයෙන් තවත් මාර්ගයකට පිවිසුමක් ඇති බැවින් එම ස්ථානය පුළුල් කළ යුතු වූ බැවින් එම ස්ථානය පුළුලව ඉදිකළ බවත් එසේ ඉදි නොකළහොත් එම මාර්ගය සේදී යාමට ලක්වී විනාශ වන බැවින් සෑදූ මාර්ගයෙන් ප්‍රයෝජනයක් නොවන බව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම මාර්ගය ඉදිකර අවසන්ව මෙම ඇස්තමේන්තු ඉදිරිපත් කරන බැවින් මෙය අනුමත කිරීමට කැමති බව ප්‍රකාශ කළද මෙම ක්‍රමවේදයට විරෝධතාවය ප්‍රකාශ කළ අතර දිගින් දිගටම මෙවැනි ක්‍රියාවන් සිදු නොවීමට වගබලා ගතයුතු බවද ගරු මන්ත්‍රී එම්.එම්.තිස්ස ගුණසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසූ අතර අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ බහුතරයකගේ එකඟතාවය මත සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>**

## <u>05.02.01.කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.</u>

2025.11.06 දින පැවති කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ නිර්දේශ කරන ලද පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

01. රදලියද්ද ආදාහනාගාරයේ වතුර ටැංකියේ උඩු පියන ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

02. නව රථවාහන සේවා මධ්‍යස්ථානයට විදුලි සම්බන්ධතාව ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

03. ලේඛනාගාරයේ බිම තබා ඇති ලිපි ගොනු ඇසිරීම සඳහා රාක්ක ගැසීමට කාර්මික නිලධාරිගේ උපදෙස් අනුව සකස් කර ගැනීම.

04. බිබිල මහජන පුස්තකාලයේ පුස්තකාලාධිපති කාර්යාල කාමරයේ ජනෙලය සඳහා තිර රෙද්දක් ප්‍රසම්පාදනය කර මිලදී ගැනීම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

මෙම යෝජනාව පිළිබඳ විවාදයක් සිදු නොවූ අතර විවාද අවස්ථාව අවසන් බව ගරු මූලාසනය විසින් දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමි වූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.</u>

- 2025.11.06 දින පැවති කාර්මික සේවා පිළිබඳ කාරක සභාවේ වාර්තාව
- 2025.11.06 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක කාරක සභාවේ වාර්තාව

මෙම ගරු සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.

2025 ඔක්තොබර් මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 8,858,376.16 |
| මූලධන ලැබීම් | - රු. 4,047,534.97 |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබීම් | - රු. - |
| මුළු ලැබීම් | - රු.12,905,911.13 |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 9,530,281.83 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 3,918,510.46 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 2,076,001.89 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු 15,524,794.18 |

**2025.10.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 17,107,054.15 |
| අක්කර බදු | - රු. 6,338.74 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 1,936,961.59 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 706,907.00 |
| කුලී මුදල් | - රු 1,738,416.17 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,830,154.74 |
| එකතුව | - රු 24,325,832.39 |

## 08.වෙනත් කරුණු

**ගරු මන්ත්‍රී ජේ.ඒ.ජී.විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා අදහස් දැක්වීම.**

දම්පතිගම මාර්ගය දැනට ගමන් කිරීමට නොහැකි ලෙස අබලන් වී ඇති බවත් වාහන දෙකක් මාරුවීමට තරම්වත් මෙම මාර්ගය ප්‍රමාණවත් නොමැති බවත් පැවසූ අතර මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අදාළ ආයතන දැනුවත් කළයුතු බව දන්වා සිටින ලදී.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා අදහස් දැක්වීම.**

මෙම දම්පති මාර්ගය අනතුරක් සිදුවීමට පෙර ප්‍රතිසංස්කරණය කළයුතු බව මාර්ග සංවර්ධන අධිකාරියේ ඉන්ජිනේරු මහතා හට දැනුවත් කර ඇති බවත් මෙය ඉතා කඩිනමින් ප්‍රතිසංස්කරණය කළයුතු බව පැවසීය.

2026 මංගල අයවැය ඉදිරිපත්කළ මෙම අවස්ථාව සඳහා මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා අයවැයට පක්ෂව හා විපක්ෂව අදහස් දක්වමින් ජනතා නියෝජිතයින් ලෙස තමාගේ කාර්ය ඉටු කිරීම පිළිබඳ ස්තූතිය පුද කරමින් මෙම ගරු සභාවේ ඉදිරිපත්වූ යෝජනා මූල්‍යම හැකියාව යටතේ ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන බවත් පැවසූ ගරු මූලාසනය විසින් 2025 නොවැම්බර් මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කර 2025 දෙසැම්බර් මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මත දෙසැම්බර් 16 දින පෙ.ව.9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව නොවැම්බර් මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -
01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමේදී දක්වා ඇති **2022 වර්ෂයේ දී ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුද අයවැයට විරුදධව ඡන්දය ලබාදී " අයවැය පරාද වූ බවත්"** ලෙස දක්වා ඇත. නමුත් මෙම **අයවැය පරාද වූ බවත්** යන්න ඉවත් කර සංශෝධනය කිරීම.